කතුවැකිය

තුසිත මලලසේකර

දේශීය දැනුම හා සංවර්ධනය

කුමන දේශයකට, රටකට හෝ ජාතියකට, වඩා යහපත් වන්නේ එම දේශය තුළම ජනතාව, ස්වදේශික ජනතාව, විසින් අවබෝධ කරගත්, සංවර්ධනයකර ප්‍රගුණ කළ දැනුමය. නැතහොත් දේශීය ඥානයය. සංවර්ධනය වෙමින් පවතින රටවල් තුළ වූ මෙම ඥානය දෙස සංවර්ධිතයයි පැවසෙන රටවල් වපර ඇසින් බැලුවද, එම ඥානය තුළ ගැබ්ව ඇති සාරය හෙළිදරව් වන විට, එය සොරා ගෙන යාමට තැත්කරනවා පමණක් නොව ඒවා තමන්ගේ බුද්ධිමය දේපළ බවට අයිතිවාසිකම් කීමට ද කැසකවති.

ශ්‍රී ලාංකිකයන් වන අප හටද සාඩම්බරයෙන් කතා කළ හැකි තරම් වූ දේශීය ඥානයක් කෘෂි, වාරිමාර්ග, ගෘහනිර්මාණ, තාක්ෂණ, වෛද්‍යය, සටන් කලාව, ගුප්ත විද්‍යාව ආදි ක්ෂේත්‍ර ගණනාවක් හරහා විහිදී පැතිරෙන බව සිහිපත් කළ යුතුය. එහෙත් අප අතරින් බොහෝ දෙනෙකු තුළ විශේෂයෙන් රට පිළිබඳ තීරණ ගන්නා විද්වතුන්, දේශපාලනඥයන්, නිලධාරින් ආදීහු තුළ මෙම ඥානය අවබෝධ කරගැනීමේ හැකියාවක් නොපැවතුනි. ඒ නිසාම චීනය, ජපානය, ඉන්දියාව, මියන්මාරය, තායිලන්තය ආදී ආසියානු රටවල් සිය දේශීය දැනුම උපයෝග කරගනිමින් ජගත් තලයේ හරඹපාත්දී අපි පසුබටව සිටියෙමු. එම අවාසනාවන්ත තත්වයෙන් නොනැවතී විදේශීය ඥානයට ගැතිකම් කරමින් දේශීය ඥානයට පරිභව කළ අවස්ථා ද නොපැවතුනා නොවේ.

ජාතික නිදහස ලබා වසර **60** කටත් වැඩි කාලයක් ඉක්මගයත්දී දේශීය ඥානය සතු ප්‍රබලත්වය ගැන අපගේ ඇස් ඇරෙන්නට විය. එහෙයින් දේශීය ඥානයේ ඵල ප්‍රයෝජන උපරිම වශයෙන් ලබාගැනීම සඳහා විවිධ ප්‍රයත්න දැරෙමින් පවතින බව කිවයුතුය. එහෙත් මෙම ව්‍යායාමය සාර්ථකවීමට නම් පවතින දේශීය ඥාන සම්භාරය හොඳින් අවබෝධ කරගැනීම සඳහා ක්‍රමවත් නිරීක්ෂණ හා ගවේෂණ සිදුකළ යුතුව පවතියි. එසේම මෙම ඥානය සංරක්ෂණය හා සුරක්ෂිතව භාවිත කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, ආයතන, ව්‍යුහ, යටිතල පහසුකම් පමණක් නොව අවශ්‍ය මානව සම්පත්ද ප්‍රවර්ධනය කිරීම සිදුවිය යුතුය.

මෙහිදී අවධානය යොමු කළ යුතු තවත් අංශයක් ලෙස, එදා මෙදා බොහෝ කාලයක් තුළ මෙම දේශීය ඥානය නොසිඳී, නොනැසී සුරැකීමට වෙහෙස දැරූ සියඵ භාරකරුවන් වෙත ජාතියේ ප්‍රණාමය සහ ප්‍රසාදය පළකිරීම සඳහන් කළ හැකිය.

අපගේ පාසැල් ප්‍රජාව තුළ දේශීය ඥානය පිළිබඳ පිබිදීමක් ඇති කළ යුතුව ඇත්තේ, දේශීය ඥානයෙන් ලද හැකි අනාගත ඵල ප්‍රයෝජන තිරසාරව භුක්ති විඳීමේ උරුමය ඔවුන් සතුවන බැවිනි. මෙවර විදුරාව සඟරාව දේශීය ඥානය පිළිබඳව කතා බහ කළද අතිමහත් වූ දේශීය දැනුම සම්භාරය තුළින් අපට ඉදිරිපත් කිරීමට හැකිව ඇත්තේ **කළඳක්** නොව **මංචාඩියක්** පමණක් බව සිහිපත් කිරීමට කැමැත්තෙමු.

දේශීය ජලසම්පාදන ව්‍යවහාර

ආචාර්ය ජී. බී. ධර්මසේන



අපගේ ජලසම්පාදන උරුමය අවුරුදු 5000කටත් එපිටට දිවයයි. මෙම ස්වර්ණමය යුගයේදී තිබුණාවූ තාක්ෂණික ඥානය මනා කොට ස්ථූට කරවමින්, කෘෂිකර්මය, භූමි භාවිතය, ජල සම්පාදනය, සහ ජලපෝෂක ප්‍රදේශ කළමනාකරණයෙහි විශිෂ්ට ව්‍යවහාර අදටත් දක්නට තිබේ. මහාවංශයට පෙර ලියැවුණු ඓතිහාසික ප්‍රලේඛන ජල ශිෂ්ටාචාරයෙහි මූලික හැඩගැස්ම අපට පෙන්වා දෙයි.

විජය දිවයිනට පැමිණීමට පෙර කෘෂිකර්මය සඳහා ජල සම්පාදනය කරන ලද්දාවූ සුවිසල් ජලාශ සහ ඇළ මාර්ග අපගේ මුතුන් මිත්තන් විසින් තනා තිබුණු බව විශ්වාස කෙරේ. මාදුරු ඔය ජලාශයේ දකුණු ඉවුරෙහි නව සොරොව් දොරටුවක් තැනීම පිණිස 1981 වර්ෂයේ දී කටයුතු සූදානම් කරන අවස්ථාවේදී සොරොව්ව සඳහා තෝරා ගැනුණු ස්ථානයේම අතීතයේදී තනන ලද සොරොව්වක් හමුවී තිබේ. මහාවංශයට අනුව මෙම ජලාශය තනවා ඇත්තේ මහසෙන් රජතුමන් (ක්‍රි. ව. 273) විසින් වන අතර එයින් පසු විජයබාහු රජතුමා (ක්‍රි. ව. 1055 - 1100) සහ මහා පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි. ව. 1153 - 1186) මෙම ජලාශය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කර තිබේ. කෙසේ වෙතත් පොදුජන විශ්වාසවලට අනුව විජය රජතුමාගේ ආගමනයට පෙර (ක්‍රි. පූ. 6 වන සියවස) මෙහි සිටි යක්ෂ ගෝත්‍රිකයින් විසින් මෙම සොරොව් දොරටුව සැලසුම් කොට තිබුණ බවට මතයක් පවතියි (1 වන රූපය). බොහොමයක් පුරාණ ව්‍යුහ යම් රජ කෙනෙකු විසින් තනනු ලදුව පසු අවස්ථාවලදී වෙනත් විවිධ රජවරුන් විසින් තම ප්‍රයෝජනය සඳහා ප්‍රතිසංස්කරණය කරනු ලැබ තිබේ. ඉතිහාසය සමහර අවස්ථාවලදී මෙලෙස පසුව එන රජ කෙනෙකු පුරෝගාමියා ලෙස නම් කරනු ලැබ ඇත. එවැනි එක් නිදර්ශනයක් ලෙස කාශ්‍යප රජතුමා (ක්‍රි. ව. 478 - 496) විසින් තනනු ලැබුවා යැයි විශ්වාස කෙරෙන සීගිරිය රාජධානිය සතුව ක්‍රි. පූ. 3000 වන තෙක් දිගු ඉතිහාසයක් තිබෙන බවත් එක්තරා ඓතිහාසික ලේඛනයකට; වර්ග පුරාණයට (පන්ච රක්ඛවාලීහි වෙළුම් පහෙන් එකකට) අනුව, රාවණා රජුටත් පෙර රජකම් කරන ලද සිංහමුඛ නමැති රජතුමා ඉන්දියාවෙන් කැඳවාගෙන ආ විශ්වකර්මයාගේ උපකාරය ඇතිව මෙම රාජධානිය ගොඩනගා ඇති බවට විශ්වාසයක් පවතියි.



1 වන රූපය : මාදුරු ඔය ජලාශයෙහි ඉපැරණි සෙරොව් දොර.

සීගිරිය රාජධානියෙහි සතුටු උයන්



2 වන රූපය : පිදුරංගල පර්වතය - පුරාණ වැසි ජල රැස්කිරීම

ගොඩනැගුවේ කවර රජකෙනෙකු වුවද උයනට ජලසම්පාදනය කිරීමට සහ එහි වූ තොරතුරු සහ වතුර මල්වලට ජලය සැපයීමට එම රජතුමාට සාපේක්ෂව උස් ස්ථානයක ජලය එක්රැස් කරගැනීමට අවශ්‍යතාවයක් මතුවන්නට ඇත. මෙම අවශ්‍යතාවය සපුරාලීම ඒ ආසන්නයේම වර්ෂා ජලය රැස්කිරීමේ පද්ධතියක් ගොඩනැගීම මගින් සිදුකරන්නට ඇත. ස්වභාවික හැඩය බිඳ දමා අපදා ජල ප්‍රවාහ මං බවට පරිවර්තනය කොට ඇති පිදුරංගල පර්වතය සීගිරිය රාජධානියට ජල ප්‍රභවය වූ බවට විශ්වාස කළ හැකිය (2වන රූපය).

පිදුරංගල පර්වත මස්තකයෙහි තැනිතලා ප්‍රදේශය හෙක්. 02ක් පමණවේ. මෙම වපසරිය මතුපිටින් ගලායන ජල ප්‍රමාණයෙන් එක්රැස් කරගත හැකි මාසික වර්ෂාපතනය 80%ක් බව උපකල්පනය කළහොත් මසකට ගබඩා කරගත හැකි ජල පරිමාව පහත සඳහන් පරිදිවේ (1 වන වගුව). මෙම ගණනය සිදුකිරීම පිණිස DL 1b AE කලාපය සඳහා වර්තමාන වර්ෂාපතනය ලැබීමේ සම්භාවිතාවය 75%ක් ලෙස සලකනු ලැබ තිබේ. මෙම ගණනය කිරීමට අනුව ඉහත කී පද්ධතියෙන් අවම වශයෙන් ජලය ඝනමීටර් 10,000ක් එකතු කර ගත හැකිවේ. මෙයින් අදහස් කෙරෙන්නේ කුමක් ද? මෙම ඓතිහාසික ප්‍රත්‍යක්ෂය මිථ්‍යාවක් යැයි යමෙක් බැහැර කළ හැකිය. කෙසේ වෙතත්, මෙම පද්ධතිය ප්‍රතිසංස්කරණයකට ලක් කරන්නේ නම් එය ඒ අවට වාසය කරන, එමෙන්ම හේතුකාරකය නොදන්නා නිදන්ගත වකුගඩු රෝගයෙන් තර්ජනයට ලක්වූ ජනතාවට වාර්ෂිකව ඝනමීටර් 10,000ක වර්ෂික ජල සංචිතයක් සම්පාදනය කෙරෙනු ඇත.

විජය මෙම දිවයින ආක්‍රමණය කිරීමට පෙර පවා අපගේ මුතුන් මිත්තන් විසින් ජලසම්පාදනය උදෙසා වූ ජල සම්පත් කළමනාකරණය කෙරෙහි උපරිම අවධානය යොමු කරනු ලැබ ඇත. පහත දැක්වෙන පරිදි ජල කළමනාකරණයෙහි විවිධ මට්ටම්වලදී මෙය විස්තර කළ හැකිය.

අන්තර් - ගංගා ද්‍රෝණි කළමනාකරණය

ශ්‍රී ලංකාවේ ගංගා ද්‍රෝණි 103ක් තිබුණ ද ඉන් සමහරක් ප්‍රමාණයන් ඉතා කුඩාය. ද්‍රෝණි ප්‍රදේශය වර්ග කිලෝමීටර් 1,000 ඉක්මවන ගංගා ද්‍රෝණි ඇත්තේ 17ක් පමණි. එම ගංගා ද්‍රෝණි වන්නේ; කැලණි ගඟ, කළු ගඟ, වලවේ ගඟ, කිරිඳි ඔය, මැණික් ගඟ, කුඹුක්කන් ඔය, ගල් ඔය, මුන්දන් ආරු, මාදුරු ඔය, මහවැලි ගඟ, යාන් ඔය, මා ඔය, මල්වතු ඔය, කලා ඔය, මී ඔය, දැදුරු ඔය, සහ මහ ඔයවේ.

මෙම ද්‍රෝණිවලින් බොහොමයක් රාවණා යුගයෙහි වූ පුරාණ පරිපාලන අංශ 10 යටතේ තිබුණු ඒවා විය. මෙකී ගංගාවලින් සමහරක ජල ප්‍රමාණය දුර්වල මට්ටමක තිබුණු බැවින් එකල සිටි රජවරුන් හට "යෝධ ඇළ මාර්ග" ඔස්සේ අන්තර් - ගංගා හැරවුම් නිර්මාණය කිරීමට සිදුවිය. එවැනි යෝධ ඇළ මාර්ග සඳහා නිදර්ශන ලෙස දඹුලු ඔය - මල්වතු ඔය හැරවුම් ඇළ (ක්‍රි. ව. 860); මල්වතු ඔය කනදරා ඔය හැරවුම් ඇළ (ක්‍රි. ව. 860); සහ

1 වන වගුව : පිදුරංගල පර්වත මස්තකයෙන් මසකට එකතු කරගත හැකි ජල පරිමාව

මාසය	ජන.	පෙබ.	මාර්තු	අප්‍රේ.	මැයි	ජූනි	ජූලි	අගෝ.	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.	එකතුව
75 සම්භාවිතාවයේදී වර්ෂාපතනය (මි.මී)	30.3	12.6	26.0	87.7	31.8	3.1	3.4	4.4	25.9	132.0	168.3	105.7	631.2
අපද්‍රව්‍යය (ඝනමීටර්)	485	202	416	1,403	509	50	54	70	414	2112	2693	1691	10,099


යෝධ ඇළ - නාච්ඡදූව පෝෂක ඇළ (ක්‍රි. ව. 540), දැක්විය හැකිය. මෙම යෝධ ඇළ මාර්ගවල ශේෂ අදද දක්නට ලැබේ (3 වන රූපය).

අන්තර් ජලාශ ජල කළමනාකරණය

සමහර ජලාශ තම පෝෂක ප්‍රදේශය මගින් පෝෂණය කළ නොහැකි බව ඔවුනට පෙනී ගිය විට ඒවායේ විශේෂිත වූ අභිමතාර්ය සපුරාලීම සඳහා ගොඩනැගීම් සිදුකිරීමට ඔවුනට අවශ්‍ය විය. පැරණි අනුරාධපුර රාජධානියෙහි කුඹුරු ඉඩම් සඳහා ජලසම්පාදනය සිදු කිරීමට සහ නගරයට යටින් වූ භූගත ජල සංචිතයට නව සැපයුම් ලබාදීමට තිසා වැව සාදනු ලැබීය. ඉහත කී අභිලාෂය සපුරාලීම සඳහාම බසවක්කුලම සහ නුවර වැව ද සාදනු ලැබීය. මෙම ජලාශවල ජල ප්‍රමාණය, අවශ්‍ය කෙරෙන ජල පරිමාව සපුරාලීමට ප්‍රමාණවත් නොවූ බව හෙළිවීමෙන් අනතුරුව එකී ජලාශවලට යෝධ ඇළ මාර්ග ඔස්සේ කලාවැව සහ නාච්ඡදූව වැව වැනි වෙනත් ජලාශවලින් ජලය ගෙන යෑමට සිදුවිය. පෝෂක ඇළ මාර්ග වූ මෙම යෝධ ඇළ මාර්ග පහත සඳහන් පරිදි විය. කලාවැව, තිසා වැව, යෝධ ඇළ (ක්‍රි. ව. 470), නාච්ඡදූව වැව - නුවර වැව (ක්‍රි. ව. 290), බළලු වැව - සියඹලාන්ගමුව (ක්‍රි. ව. 290) සහ බසවක්කුලම - මහවිලච්චිය (ක්‍රි. ව. 470). 4 වන රූපය මගින් මේවා තවදුරටත් විදහා දක්වා ඇත.

කුඩා වැව් අතර ජල කළමනාකරණය

නියඟ සහ වියළි කාල මගින් කෘෂිකර්මය, සත්ව පාලනය සහ ගෘහස්ත පරිභෝජනය සඳහා නැවත නැවත ඇතිවන ජල හිඟය පුරාණ කාලයේ සිට ශ්‍රී ලංකාවේ වියළි කලාපයට අයත් ප්‍රදේශවල ග්‍රාමීය ප්‍රජාවට බරපතළ ස්වභාවික සහ ආර්ථික බාධක බවට පත්ව තිබෙන්නට



3 වන රූපය : අන්තර් ගංගා ද්‍රෝණි යෝධ ඇළ මාර්ග (මූලාශ්‍රය : බ්‍රෝහියර් 1934)

ඇත. මහාවංශය, චූලවංශය වැනි ඓතිහාසික වංශකතාවල නිරතුරුවම හමුවන නියං උවදුරු පිළිබඳ සටහන් මගින් මෙම තත්වය පෙන්වා දී තිබේ. මෙම ප්‍රදේශවල වරෙක සමෘද්ධිමත්ව නැගී සිටි පුරාණ ජල සම්පාදන ජලාශ සහ ජලමූලික සමාජය, නියඟ, ගංවතුර, සහ සෘතුමය ජල හිඟතා මගින් ඇති කරනු ලැබූ ගැටළුවලට විශිෂ්ට මානව අනුහුරුවීම මැනවින් පෙන්නුම් කර තිබේ.

හෙක්ටයාර් 246,000ක භූමි ප්‍රමාණයක් පෝෂණය කරන කුඩා වැව් 14,200ක් සහ ඇනිකට් 13,000ක් ශ්‍රී ලංකාවේ තිබේ. මෙම භූමි ප්‍රමාණය ජලසම්පාදනය කළ හැකි මුළු භූමි ප්‍රමාණයෙන් 39%ක් වේ. මෙමගින් ජාතික වී නිෂ්පාදනයට මෙ.ටොන් 191,000ක් (20%ක්) දායක කෙරේ.

අපගේ ඉපැරණි ජලසම්පාදන නිපුණතාවයෙහි ප්‍රඥා සම්පත්තිය පෙන්නුම් කෙරෙන තවත් නිදසුනක් ලෙස වැව් කැස්කේඩ පද්ධතිය අතර සහ ඒ තුළ ජලසම්පාදනය සැලසුම් කළ ආකාරය දැක්විය හැකිය. වියළි කලාපය භූ දර්ශනයෙහි තරංගී භූ ලාක්ෂණික සැකැස්ම තුළ සෑදී ඇති ජලාපවහන රටාව, අනුශාඛික ජලපවහන රටාවක් ලෙස වර්ග කළ හැකිය. මෙලෙස ජලාපවහන පද්ධතියෙහි අතු විහිදෙන ස්වභාවය "වැව් කැස්කේඩ" නම් වූ පද්ධතියක් සකස් කිරීමෙහිලා එකට සම්බන්ධ වූ ශ්‍රේණියක් ලෙස දක්නට ලැබෙන කුඩා වැව් පොකුරු සෑදීමට මග පාදා තිබේ.

කුඩා වැව් කැස්කේඩ රටාවකට පැවතීම බොහෝ ආකාරයකට වාසිදායක ලක්ෂණයක් වේ. ක්ෂේත්‍රයක් පුරා පැතිරී ඇති මතුපිට ජල ස්කන්ධයට අවම වශයෙන් සුළු ද්‍රෝණිවල පහළ කොටසෙහි භූමි පෘෂ්ටයට ආසන්නව භූගත ජල මට්ටම පවත්වා ගෙන යෑමට හැකිය. එවැනි අතු බෙදුණු වැව් පද්ධතියක් නොමැති වීම ජලාපවහන පද්ධතියෙහි ස්වභාවික අනුක්‍රමණය හේතු කොටගෙන භූගත ජලයෙහි ශීඝ්‍ර ක්ෂයවීමකට මග පාදන බව සඳහන් කළ හැකිය. එනිසා, වැව්


කැස්කේඩ නොමැති විට අද දක්නට ලැබෙන ස්වභාවික ගහකොළ කැටිනරි බෑවුම් ඔස්සේ විවිධ ස්ථානවල හමුවන ගැඹුරු මූල පද්ධතියක් සහිත විශාල ශාක විශේෂ සහිත වූ සංයුතිය නොතිබෙන්නට ඉඩ තිබුණි.

වැව් කැස්කේඩ පද්ධතියෙහි ඉහළින් වූ වැව් වර්ෂාපතනයෙන් ජනනය වන ජලගැල්ම අන්තර්ග්‍රහණය කර ගැනීමේ ස්වාරක්ෂක ජලාශ ලෙස ක්‍රියා කරයි. එසේ නොමැති වුවහොත් පහළ ඇති වැව්වල බැමි බිඳ වැටීමේ අවදානමකට ලක්වීම සිදු වනු ඇත. ඒ හා සමානවම බෝග රැකගැනීම සඳහා පහළ වැව්වලින් සපයන ජල ප්‍රමාණයෙහි හිඟ යක් ඇති වුවහොත් ඒ සඳහා ජලය සැපයීමටද ඉහළ වැව් ස්වාරක්ෂක ජලාශ ලෙස ක්‍රියා කරයි. වැව්, පොකුරු ආකාරයට මිස තනි තනිව නොපිහිටීම නිසා ඒවා ජල විද්‍යාත්මකව අන්තර් සබඳතා සහිත වන අතර තනි තනි වැව් සඳහා සැලසුම් සකස් කිරීම එම වැව් අතර ජල සම්පත් කළමනාකරණය සිදු කිරීමේදී ගැටළු සහගත තත්ව ඇති වීම වැනි අනවශ්‍ය ගැටළු ඇතිවේ.

අතීතයේදී සම්ප්‍රදායික වැව් කැස්කේඩ පද්ධතිවල තිරසර බව පවත්වාගෙන ගොස් තිබුණේ හුදෙක් ව්‍යුහමය නඩත්තු කිරීමකින් පමණක් නොවේ. පරිසර පද්ධතියෙහි සෑම සංඝටකයකටම නිසි සැලකිල්ලක් ලබාදීම මෙහිදී සිදු කර තිබුණි. කුඹුරු ඉඩම්, ජනාවාස ප්‍රදේශය, හේන් යාය, වැව් පත්ළ යනාදී මහා පරිමාණ භූමි භාවිත සඳහා පමණක් නොව ගොඩවෙල, ඉස්වැටිය, ගස්ගොම්මන, පෙරහන, කට්ටකඩුව, තිස්බඹේ, කිවුල් ඇළ යනාදී සුළු පරිමාණ - ඉඩම් භාවිත කෙරෙහිද අවධානය යොමු කෙරුණි.

කුඹුරුවල ජල කළමනාකරණය

ජල සම්පාදනය සඳහා භූගත ජලය භාවිතය පුරාණ කාලයේදී ව්‍යවහාරයට නොගැනුණි. ඔවුහු මතුපිට ජලය මගින් ජල සම්පාදනය කිරීම සඳහා නව ශිල්ප ක්‍රම සොයායැමෙහිලා



4 වන රූපය : අන්තර් - ජලාශ යෝධ ඇළ මාර්ග.

පූර්ණ පරිශ්‍රමයක් දරණ ලද්දාහ. අවට තිබෙන ගහකොළ පවත්වාගෙන යෑම සඳහා භූගත ජලය ආරක්ෂා කර ගත් අතර නියගය මගින් ඇති කෙරෙන ඉතා උග්‍ර තත්ව යටතේදී පමණක් භූගත ජලය උකහා ගන්නා ලදී. නියං අවස්ථාවකදී ගං පත්ළ සහ ස්වභාවික අවපාතන ස්ථාන යම් ගැඹුරකට සෑරීමේදී මිනිසුන්ට ජලය හමුවිය. මේවා තාවකාලික කටයුතු විය. නියං සමය අවසන් වූ විට ඔවුහු එකී වලවල් නොසලකා හැරියහ. කෙසේ වෙතත්, ඔවුහු පරිසරය ආරක්ෂා කිරීමට කටයුතු කළ අතර සහ කුඹුරු ගොවිතැනේදී භූගත ජලය කාර්යක්ෂමව භාවිත කළහ. පුරාණයේ මිනිස්සු, ජලසම්පාදනය සඳහා භාවිත කළ නොහැකි වන්නාවූ යම් ජල පරිමාවක් වැවේ ඉතිරි කොට තැබුහ. 'මඩකලුව' (වර්තමානයේ, මල සංචිතය) නමින් හැඳින්වෙන වසරේ වියළි කාලයේදී විවිධ කටයුතු සඳහා භාවිත කිරීමට ඉඩ සලසන ජලසම්පාදන සොරොව් මුවවිටට පහළින් ජල සංචිතයක් පවත්වා ගනිති. මෙමගින් මත්ස්‍ය ගහනයට තම ජීවන චක්‍රය සම්පූර්ණ කිරීමට, අවට ගස් නොනැසී පැවතීමට, ගවයින්ට දිය බීමට, මිනිසුන්ට තම රෙදි සෝදා ගැනීමට හා සමහර අවස්ථාවලදී ස්නානයට ඉඩකඩ ලබාදීම සිදුකෙරේ.

අපේ පැරැන්නන් භූගත ජලය කිසිවිටෙකත් වී වගාව සඳහා භාවිත කර නැතැයි යමෙකු තර්ක කළහොත් එය පිළිගත නොහැකිය. ඔවුහු අධිභාවිතයකින් තොරව භූගත ජලය වී වගාව සඳහා භාවිත කළහ. වසරේ බොහෝමයක් මාසවලදී භූගත ජලය නොගැඹුරු මට්ටමක පවතින ජලවහනය දුර්වල ඉඩම්වල පමණක් අතීතයේදී ගොවියෝ වී වගා කිරීම සිදු කළහ. මෙම ක්ෂේත්‍රය "පුරාණ වෙල" (පැරණි ක්ෂේත්‍රය) ලෙස හඳුන්වනු ලැබේ.

භූගත ජල තල ගැඹුර සෙ.මී. 50කට අඩු මට්ටමක පවතින්නේ නම් එවිට මතුපිට පසේ වූ තෙතමන ප්‍රමාණය වී බෝගය වගා කිරීමට ප්‍රමාණවත් බව පිළිගැනුණි. ඉතා වියළි මහ කන්නයකදී පමණක් ඔවුහු ජලසම්පාදනය සිදු කළහ. මහ කන්නයෙන් පසුව වැවේ ඉතිරිවන ජල ප්‍රමාණය භාවිත කොට යල කන්නයේදී වී වගා කිරීමට ඔවුනට හැකි වූ හේතු අතරින් එකක් ලෙස මෙය දැක්විය හැකිය.

බෙත්ම ගොවිතැන

මහ කන්නයේ වගා කිරීමෙන් අනතුරුව යල කන්නය වගා කරනවාද නොඑසේ නම් වැවේ ජලය හිඟකම කරණ කොටගෙන කුඹුරු යාය එම කන්නය තුළ වගා නොකර අත්හැර දමනවාද යන්න තීරණය කිරීමට ගොවි ප්‍රජාවට සිදු විය. සමහර යල

කන්නවලදී සම්පූර්ණ කුඹුරු යායම වගා කිරීමට ප්‍රමාණවත් නොවන යම් ජල පරිමාවක් වැවේ ඉතිරි වී තිබෙන අවස්ථා දක්නට ලැබේ. මෙවන් වාතාවරණයක් තුළ වැව් ජලයෙන් වගා කළ හැකි මුළු කුඹුරු වපසරිය තාවකාලිකව ගොවියන් අතර නැවත බෙදාගැනීමක් මගින් වගා කිරීම සිදු කරනවාද නැද්ද යන්න පිළිබඳව මිනිසුන්ට තීරණය කිරීමට සිදු විය. යාය නැවත බෙදීම මගින් වගා කිරීමේ මෙම ක්‍රමයට "බෙත්ම" යැයි කියනු ලැබේ.

තාවලු ගොවිතැන

ඉදිරි මහ කන්නය තුළ වර්ෂාපතනය ඉතා දුර්වල බව සහ වැවේ ජලය නොමැති බව මිනිසුන්ට වැටහී ගිය විට "තාවුල" හෝ "තාවල්ල" හෝ ලෙස හැඳින්වෙන වැව් පත්ලේ ඉහළ කොටස වගා කිරීම සඳහා ඔවුහු තීරණය කළහ. මිනිස්සු තාවලු පෙදෙස වට කොට වැටක් සකස් කළ අතර "මහ නියර" (ප්‍රධාන බැම්ම) නමින් හැඳින්වුණු තාවුලෙහි පහළ සීමාව ඔස්සේ කණ්ඩියක් සකස් කිරීම සිදු කළහ. මෙම මහනියර, ප්‍රදේශයට ලැබෙන සීමිත වර්ෂා ජලය හෝ අපදා ජලය හෝ එක්රැස් කිරීමට සහ වැව්පත්ළ වෙත අවසාධිත ගෙනයෑම වැළැක්වීමට සකස් කරන ලද්දක් විය. අප්‍රේල් මාසයේ පැවැත්වෙන අලුත් අවුරුදු උත්සවයට පෙර අස්වැන්න නෙලා ගැනීම ඉලක්ක කොටගෙන මිනිස්සු තම වගාව නොවැම්බර් මස මුල්දී ආරම්භ කරති. ඉහළ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයක් අන්තර්ගත වීම හේතු කොටගෙන වැව් පත්ලේ පස ඉතා සරුසාර විය.

කැකුලම

ඉදිරි මහකන්නයේ වර්ෂාපතනය පිළිබඳව දැනගැනීම සඳහා ගොවීන් සතුව විවිධ දර්ශක තිබුණි. ඒ අතරින් එකක් ලෙස සැප්තැම්බර් මස මැද එළඹෙන 'බිනර කලුව' සැලකිය හැකිය. 'බිනර කලුව' මහ වැසි රැගෙන පැමිණියේ නම්, මහකන්නය තුළ පසේ රුඳී තිබෙන තෙතමනය භාවිත කොට තම කුඹුරුවල 'වියළි ඉසීම' මගින් වී වගා කිරීම ආරම්භ කරති. මන්දයත් බිනර කලුවට මහ වැසි වැටුණු විට ඉදිරි මහ කන්නයේදී වැව පිරීමට තරම් ප්‍රමාණවත් ලෙස වර්ෂාව නොලැබෙන බව ඔවුහු දැන සිටියහ. අප මහඉලුප්පල්ලම වර්ෂාපතන දත්ත විශ්ලේෂණය කළ විට මෙම දර්ශකය සත්‍යයක් බව පැහැදිලි විය. සැප්තැම්බර් වර්ෂාපතනය සමග මහකන්නයේ ලැබෙන වර්ෂාපතනයෙහි සිදුවන විචලනය පෙන්නුම් කොට ඇත.

'කරහන'

ක්ෂේත්‍ර මට්ටමේ ජලසම්පාදන ජලය පාලනය කිරීම සඳහා යොදාගත් ලොව පැරණිතම ජලය බෙදාහැරීමේ උපකරණය ලෙස මෙය හඳුන්වනු ලැබේ. ගැඹුරින් සහ පළලින් එකිනෙකට වෙනස් ප්‍රමාණවලින් යුත් අමුණු හැඩැති කැපුම් දෙකක් සහිත ලී කොටයකින් මෙම උපකරණය සකස් කොට ඇත. විවිධ මුදාහැරීම් සහිත දිශා දෙකක් වෙත ජල ප්‍රමාණය මෙමගින් හරවාලනු ලබයි. ගමරාලට හෝ වෙල් විදානේට හෝ එහි පාලනය භාර දී තිබුණි.

'දහ අණ', දේශීය ගම්මානවල දස අඥාව

'දහ අණ' නමින් ගමේ හඳුන්වන, මිනිසුනට කීකරු වීම සඳහා ආඥා දහයක් එකල තිබුණි. ජල සුරක්ෂිතතාවය, ආහාර සුරක්ෂිතතාවය, පරිසර සුරක්ෂිතතාවය, යනාදී අංශ එමගින් ආවරණය කෙරුණි. ගමේ ප්‍රධානියා විසින් ක්‍රියාත්මක කෙරෙන දහ අණ පහත සඳහන් පරිදි වේ.

i. දිය පත්තායම් තහන්චිය - ජල හිඟතාවය පවතින කාලවල වගාව සඳහා භාවිත කිරීම හෝ වෙනත් ආකාරවලින් ජලය දූෂණය කිරීම හෝ තහනම් කිරීමට මෙම අණ ක්‍රියාත්මක කෙරේ (ජල සුරක්ෂිතතාවය).

ii. නියම කන්නයට ගොවිතැන් බත් - වගා කිරීමේ අවදානම මගහැරීම සඳහා "වෙල් විදානේ " (ජල කළමනාකරණ ප්‍රධානියා), ගමරාල (ගමේ ප්‍රධානියා), සහ "නැකත් රාල" (නැකැත්කරුවා) විසින් තීරණය කරනු ලබන වගා කාලය ගම්මුන් විසින් අනුගමනය කළ යුතු වේ (අවදානම වළකා ගැනීමේ ගොවිතැන).

iii. ගහකොළ සතා සීපාවා - බින්කරේ වතුරයි ආයිබෝවා - ජල සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා පරිසරය (වනාන්තරය සහ වල් සතුන්) ආරක්ෂා කිරීම (පරිසරික ආරක්ෂාව).

iv. හිතේ ඉස්පාසුවට දන් පින් කරන්නට - පැටිපස් පරාණේ හදාපන් - වදාපන් - මනස ආගමික කටයුතුවල යෙදවීම පිණිස නිදහස් කරගැනීම සඳහා සුරතලුන් පස්දෙනෙකු (දරුවා, වසුපැටවා, සුනඛයා, බළලා, සහ කුකුළු පැටවා) ඇති කර රැකබලා ගැනීම (සරල ජීවන රටාව).

v. ආකාසේ වැහි කෙතෙන් - වැව් අමුණු පුරවාපන් - වැව් සහ ඇනිකට් වැහි වතුරෙන් පිරවීම (වැසි ජලය රැස් කිරීම).

vi. එකතු පහදු නොවී - හරිහමන් වැඩක් නොකරන් - කණ්ඩායමක් ලෙස ඕනෑම කටයුත්තක යෙදීම (කුඩා කණ්ඩායම් සංකල්පය).

vii. වී කුරහන් සම්භාරේ - අටු කොටු පුරවාපන් රාලේ - ස්වභාවික ව්‍යසන මගින් බෝග පාලුව ඇති කළ හැකිය. එහෙයින්, අනාගත භාවිතය සඳහා ඔවුන් ධාන්‍ය ගබඩා කිරීම සිදු කළ යුතුය (ආහාර සුරක්ෂිතතාවය).

viii. තෙල් පැණි ඇත්නම් - කැවුම්ද පැඳ්ඤං - බාහිර ආධාර පිළිබඳ බලා නොසිට ස්වාධීන වීම සඳහා වගබලා ගත යුතුය (ස්වයං නිදහස).

ix. කෙම් පහන් දැනගන් - සතුහරේ රැකගන් - තිරසර බව ළඟා කරගැනීම සඳහා ඔවුන් ලබාගන්නා දැනුම ප්‍රායෝගිකව යොදා ගත යුතුය (දැනුම ආරක්ෂා කිරීම).

x. කවි සිංදු රාගෙන් - හිතට කාවද්දාපන් - තම සංස්කෘතියට අයත් සිරිත් විරිත් ක්‍රියාවට නැංවීම අඛණ්ඩවම කරගෙන යා යුතුය (සංස්කෘතිය ආරක්ෂා කිරීම).

ආචාර්ය ජී. බී. ධර්මසේන
077613234

සම්ප්‍රදායික දැනුම : උපරි දැක්මක් සහ ප්‍රත්‍යක්ෂ සමාලෝචනයක්

එම්. අසෝක ටී. ද සිල්වා



අප පුරාතනයන් මැනවින් සංවිධාන ගත කළ වැව් සහ ඇළ පද්ධතියක් ඇති කරනු ලැබූයෙත්, වන ආවරණය සුරකිමින් සහ ජල සම්පත් සුරක්ෂිත කරමින් මානව ජනාවාස පිහිටවනු ලැබුවේත් මතු පරපුර සඳහා වූ පරිසරය සුරක්ෂිත කරමිනි. විවිධ වූ වර්ග සතු ආහාරමය අගය, රසවත්භාවය සහ ඖෂධීය ගුණය වැනි සුවිශේෂී ලක්ෂණ පිළිගනිමින් ඒ ඒ වූ වර්ග ඒවාට සුදුසු අවස්ථාවන්හීදී වගා කරනු ලැබූයේ ස්වභාවධර්මයෙන් ලද තිලිණ, තිරසාරව භුක්ති විඳිමට පමණක් නොව මිල කළ නොහැකි ජෛව විවිධත්වයද ආරක්ෂා වන පරිද්දෙනි. ආහාර, ඖෂධ, ඉන්ධන සහ පෝෂය සඳහා බහු අදියර ගොවිතැන් ක්‍රම තම ගෘහස්ථ පරිසරය තුළදී අනුගමනය කරන විට ජනක ප්ලාස්මය ඒ වෙලේම සුරකිනු ලැබුවා පමණක් නොව ස්වභාවික වන ආවරණය පිළිබඳ විඩම්බණයක්ද ඇති කරමිනි. ශ්‍රී ලංකාව ලෙස නම් ලබන මෙම කුඩා දූපතෙහි වෙසෙන දූපතුන් මෙම අද්විතීය සංස්කෘතික සහ සම්ප්‍රදායික ප්‍රඥාවේ සාඩම්බර උරුමකරුවෝය. ගෙවී ගිය කාලය තුළ පරම්පරාවෙන් පරම්පරාවට නිරීක්ෂණය වෙමින්, සුපෝෂණය සහ ඔපමට්ටම් වීම සිදු වූ බවට හැඳින්විය හැකි ක්‍රියාවලියක් තුළින් පරිණාමය හෝ චිරස්ථිතිය හෝ වීම සිදුව ඇත.

යටපත් කිරීමට කොතරම් උත්සාහ දැරුව ද සම්ප්‍රදායක ප්‍රජා තුළ මෙන්ම මුඛ මාර්ගයෙන් සන්නිවේදනය වීම මගින් හෝ පුරාණ ග්‍රන්ථ (උදා: සුශ්‍රැතය) තුළ අන්තර් ගත කර හෝ ආධුනික පුහුණුවන්නන් හට, ගුප්තව බෙදාගත් දැනුම ප්‍රායෝගික අවස්ථාවන්හීදී සම්ප්‍රේෂණය කිරීම හෝ මගින් අදටත් අතිමහත් දැනුම් සම්භාරයක් අප සතුව පවතියි. වර්තමාන ලෝකයේ පරිසරය සමග සුසංගත වූ ජීවිතයක් ගත කිරීම සඳහා අස්වැසිල්ලක් සහ මාර්ගෝපදේශ ලැබීම සඳහා සොයායනු ලබන්නේ මෙම ප්‍රඥාවය.

ලෝක සන්දර්භය

■ **සම්ප්‍රදාය පදනම් කරගත් සාහිත්‍යය, කලාත්මක හෝ විද්‍යාත්ම කාර්ය, කාර්යසාධක, හැකියා දැක්වීම්, නිෂ්පාදන, විද්‍යාත්මක සොයාගැනීම්, සලකුණු, නම් සහ සංකේත, හෙළිදරව් නොවූ තොරතුරු සහ විද්‍යාත්මක, සාහිත්‍යයට හෝ කලාත්මක ක්ෂේත්‍රයන්හි බුද්ධිමය ක්‍රියාකාරකම් හී ප්‍රතිඵල ලෙස ලැබුණු සම්ප්‍රදායික බව පදනම් කරගත් නවෝත්පාදන හා නිර්මාණ,** සම්ප්‍රදායක දැනුම ලෙස ලෝක බුද්ධිමය දේපළ සංවිධානය පිළිගනු ලබයි.

■ ජෛව විවිධත්වය පිළිබඳ ප්‍රඥප්තියෙහි 8වන වගන්තිය සම්ප්‍රදායික දැනුම විස්තර කරනුයේ, **කෘෂිකර්මය, ධීවර, සෞඛ්‍යය, ගෙවතුවගාව සහ වන වගාව විශේෂ කොට ලෝකය පුරා විසූ දේශීය ප්‍රජා සතුව තිබූ දැනුම, නවෝත්පාදන සහ ව්‍යවහාර ලෙසය.**

■ මෙයට වසර 45 කට පමණ ඉහත දී ලෝක සෞඛ්‍ය සංවිධානය ප්‍රාථමික සෞඛ්‍යයෙහි ලා සම්ප්‍රදායික වෛද්‍යයහි සම්පත්ධාරීත්වය සහ බලපෑම අධ්‍යනය කිරීමේ මූලාරම්භයක් තැබීය. සම්ප්‍රදායික දැනුම ක්‍රමානුකූල ලෙස සංග්‍රාහත්මක කිරීමට, නියාමනය කිරීමට, ඉගැන්වීමට, ව්‍යවහාරයට යෙදවිය හැකිබව පිළිගැනීමත් සමගම ලෝක සෞඛ්‍යය සංවිධානය සම්ප්‍රදායක වෛද්‍යය යන්න නිර්වචනයට "යහ පැවැත්ම පවත්වා ගෙන යාමට, ප්‍රතිකාර කිරීමට, රෝග නිවාරණයට හෝ රෝග වැළැක්වීමට, තනිව හෝ කිහිපයක සාමූහිකත්වයෙන් යොදාගත හැකි

ශාක, සත්ව සහ හෝ බනිජ පදනම් කරගත් ඖෂධීය ප්‍රතිකාර, අධ්‍යාත්මික ප්‍රතිකර්ම, හස්තීමය ශිල්ප සහ ව්‍යායාම අයත් විවිධ සෞඛ්‍යමය ව්‍යවහාර, ප්‍රවේශ, දැනුම සහ විශ්වාස ඇතුළත් වුවක්" ලෙසද අන්තර් ගත කිරීමට ද පියවර ගනු ලැබිණ.

සම්ප්‍රදායික ප්‍රඥාවේ ගති ලක්ෂණ

සම්ප්‍රදායික ඥානයෙහි මූලික ලක්ෂණ වනුයේ,

1. සමාජයීය අවශ්‍යතා සපුරාලීම සඳහා සිය පරිසරය සමග මිනිසා ඇති කරන අන්තර් ක්‍රියාවන් හී ප්‍රතිඵලයක් වීම.

2. ස්වභාවික සම්පත් කළමනාකරණය, කෘෂිකර්මය, දේශගුණය සහ ජලය, ආහාර සුරක්ෂිතතාවය, තාක්ෂණය, ප්‍රවේණික සම්පත්, සහ පරිසර පද්ධති කෙරෙහි ප්‍රධාන ලෙස අවධානය යොමු කිරීම.

3. සම්පත් භාවිතය පාලනය සඳහා වන සැකිල්ල ඇතිකරනුයේ සම්ප්‍රදායික ඥානයය. මෙම දැනුම ස්වභාවික පිළිගැනීමට, හඳුනාගැනීමට සහ ගෞරවය දැක්වීමට ක්‍රියාකරයි.

4. සම්ප්‍රදායික දැනුම බොහෝවිට එක් පුද්ගලයෙකුගේ පෞද්ගලික දේපළක් ලෙස සලකනු නොලැබෙයි. එවැනි අවස්ථාවන්හිදී සම්ප්‍රදායික ඥානයේ අයිතිය වර්තමාන පුද්ගලයන් හෝ කණ්ඩායම් ඉක්මවා ගිය විශාල කණ්ඩායම් වෙත සතුකරයි.

5. වර්තමන විද්‍යාත්මක ලේඛන මෙන් සම්ප්‍රදායික ඥානය ලේඛන ගතකර නොමැත. එය බොහෝ විට කටවචනයෙන් පැවරෙන්නකි. එසේ නැතහොත් කියවා බලා තේරුම් ගැනීමට විශේෂ කුසලතා සමුහයක් අවශ්‍ය කෙරෙන ගුප්ත භාෂාවකින් ලියා තිබීම සහ

6. එසේම සම්ප්‍රදායික ඥානය භාවිතයේදී ද ඒවායේ ආරම්භයේ සිට පැවතිය හැකි සාරධර්මමය බැඳීම් කෙරෙහිද සබඳතා පවත්වයි.

ප්‍රත්‍යක්ෂ සමාලෝචන වී වගාව සඳහා පිරිවැය ඵලදායී දේශීය ක්‍රම

උතුරු මැද පළාතේ විලච්චිය සහ ගල්නෑව යන ගම් ප්‍රදේශවල ගොවීන් සිය දෙනෙකු පමණ "නව කැකුලම" ලෙස හැඳින්වූ වෙනස් ආකාරයක වී වගා කිරීමේ ක්‍රමයක් අනුගමනය කරනු ලැබීය. මෙම ක්‍රමයෙනි එක් වැදගත් ලක්ෂණයක් නම් කිසිදු බිම් සැකසීමකින් තොරව වැපිරීමේ ශිල්පයක් අනුගමනය කිරීමය. වල් පැළෑටි කපා දමා ලියැද්දක් ඉවත් කළද නියරට අත තැබීමක්වත් සිදු කරනු නොලබයි. බීජ වී ඉන්පසුව ඉපනැල්ල මතට ඉසුනු ලබයි. ඉන්පසුව එය අඟල් 3ක් පමණ ඝනකම් වූ වියළි පිදුරු තට්ටුවකින් ආවරණය කරදමයි.

> ගොයම් පැලයේ අංකුර වෙනත් පැල වර්ග (වල් පැල) මෙන් නොව ඉහළට එල්ල වෙමින් වේගයෙන් වැඩෙන විට ඇතුරූ පිදුරු තට්ටුව පස සරු කරගෙන, එම හැකියාව නොමැති වල්පැළෑටිවල බලපෑම් බාධාවකින් තොරව වර්ධනය වන බව ගොවීහු දනිති. ගොවීහු කිසිදු කෘෂි රසායනයක් භාවිත නොකරන අතරම ලියැදි සූදානම් කිරීමද අඩු වියදමකින් සිදු කරති. මෙනිසා ලැබෙන ලාභය අධිකය.

වාරිමාර්ග ජලය සපයන විට මේ සඳහා ප්‍රදේශයේ වාරිමාර්ග අධිකාරිය සමග කතාබහ කර ඒ සඳහා සුදුසු සුබ දිනයක් සහ වේලාවක් සකසා ගනු ලබයි. වැසි ජලයෙන් වගා කිරීමේදී ද ජෝතිෂ්‍යමය කරුණු සලකා බලා වේලාවක් තීරණය කරනු ලබයි. මේ අවස්ථා දෙකේදීම ගමේ පන්සලේ හාමුදුරුවරු හෝ ගිහි වැඩිහිටියන් හෝ විසින් පිරිත් දේශනා කර අධ්‍යාත්මික ව්‍යවහාරයන් හී යෙදීම සිරිතක් ලෙස අනුගමනය කරන අතරම වාරිත්‍ර අතර



ප්‍රථම පස් පිඬැල්ල (ආචාර්ය පිඬැල්ල) කැපීම සඳහා අඟත් උදැල්ලක් භාවිත කිරීම, එම මුල් පිඬැල්ල කුඹුරේ පහළම ලියැද්දේ තැබීම, ගම්වැසියන්ට දානය (ආහාර) පිරිනැමීම සහ ශ්‍රම සහාය ලබාගන්නා ආකාරය නිගමනය කිරීම ආදිය පවතියි.

මුල් වැසි වැටීමත් සමගම හෝ වාරිමාර්ග ජලය මුදාහැරීමත් හෝ සමග පැළවෙන බීජ වී ඇට ලියද්ද ඇතුරූ පිදුරු මතින් ඉහළට අංකුර අතුර ඇදීමට සලස්වයි. ලියැද්දේ වතුර බැඳ නොතිබුණත්, වල් පැළැටි වැවීමකින් තොරව ගොයම් පැළ වගාව හොඳින් ස්ථාවරව තිබෙනු දැකිය හැකිවීම විශ්මයකි. ගොයම් පැලයේ අංකුර වෙනත් පැල වර්ග (වල් පැල) මෙන් නොව ඉහළට එල්ල වෙමින් වේගයෙන් වැඩෙන විට ඇතුරූ පිදුරු තට්ටුව පස සරු කරගෙන, එම හැකියාව නොමැති වල්පැළෑටිවල බලපෑම් බාධාවකින් තොරව වර්ධනය වන බව ගොවීහු දනිති. ගොවීහු කිසිදු කෘෂි රසායනයක් භාවිත නොකරන අතරම ලියැදි සූදානම් කිරීමද අඩු වියදමකින් සිදු කරති. මෙනිසා ලැබෙන ලාභය අධිකය. එහෙත් එම ගොවීන් ලද අස්වැන්න, වර්තමාන ක්‍රම භාවිතයෙන් ලැබෙන අස්වැන්නට වඩා සියයට 20-30 කින් පමණ අඩුය.

නව කැකුලම වගා ක්‍රමයට පළිබෝධ කළමනාකරණය සඳහා ද අඵත් ක්‍රමයක් පැවතින. මෙම ගොවීන්ට අනුව ගොයම් වගාවට හානි කරන කෘමි පළිබෝධ එසේ කරනුයේ ඔවුන්ගේ පැවැත්ම සඳහා වෙනත් ශාක විශේෂයක් සොයා ගැනීමට නොහැකි වීම නිසාය. ඔවුන්ට අනුව සිය පැවැත්ම සඳහා ආහාර ලබා ගැනීමට තිබෙන ශාක අතුරින් අඩුම වැදගත්කමක් ඇති ශාක විශේෂයක් වන්නේ ගොයම්ය. එහෙයින් නියර පිරිසිදු නොකර තැබුවහොත් නියරෙහි වැවී ඇති ශාක සහ පැළ වර්ග මත යැපෙමින්

පළිබෝධ, ගොයම් පැළවලට සිදු කරන හානිය අවම වනු ඇති බව ගොවීහු විශ්වාස කළහ.

කෙසේවුවත් මෙම ගොවීහු අධ්‍යාත්මික සහ වෙනත් විධි ක්‍රමද භාවිත කළහ. ඒ පිළිබඳව එක් බැතිමත් ගොවි මහතකු පැවසුවේ තමන් අල්ලා ගත් කෘමි පළිබෝධ කිහිප දෙනෙකුට පිරිත් ගාථා කිහිපයක් ගායනා කර ඔවුන්ට සජීවීවම මුදාහළ බවය. ඔහු කියා සිටියේ එවැනි පළිබෝධ යළි කිසි දිනෙක කුඹුරු වෙත නොපැමිණි බවය. එය සනාථ කිරීම සඳහා ඔහු තමන්ගේ කුඹුර, අසල පිහිටි කුඹුරු සමග සන්සන්දනය කරනු ලැබුයේ අනෙක් කුඹුර තදින්ම පළිබෝධ උවදුරුට ලක්ව ඇති බව දක්වමිනි.

අනෙක් ක්‍රමය වූයේ පළිබෝධ විසර්ජනය කරන ශාක ද්‍රව්‍ය භාවිත කිරීමය. පරිසරකමය ගොවිතැනේ නියැලුන උඟව පළාතේ ගොවීහු, රළු තලපයක් සකස් කළේ කොහොඹ කොළ සහ මහ පට්ටා නම් ශාකයේ කොළ එකට ඇඹරීමෙහි මෙම තලපය රෙදි කැබැල්ලකින් ඔතා ලියැද්දේ ජලය ගලා එන වක්කඩෙහි තැබීමෙන් සිය කුඹුරට එන පළිබෝධ පලවා හැරිය හැකි බව ඔවුහු අත් දුටුවහ.

එළවළු වගාව සඳහා දේශීය පළිබෝධනාශක ක්‍රම

පරිසරකමය ගොවිතැන් කටයුතුවල නියැලි ලුනුවත්ත, රාහුපොළ / තියාපොළ යන උඟව පරණගම සහ මොණරාගල ගොවීහු ශස්‍ය මරු ක්‍රමයට ගොවිතැන් කළහ.



බෝග මාරු ක්‍රමයට වගා කිරීමේ අනුක්‍රමය සම්ප්‍රදායික ගොවීන්හට මෙන්ම නව ශිල්ප ක්‍රම භාවිත කරන්නවුන්ට ද එකම විය. සාමාන්‍යයෙන් වී වගාවකින් පසුව බෝංචි වැනි එළවළු බෝග යක් වගා කිරීම සිදුවිය. එය කෘමි පළිබෝධ හානියට ග්‍රහණශීලි වුවකි. ගොවිතැන් සඳහා දේශීය ක්‍රම භාවිත කරන ගොවීහු කෘමි පළිබෝධ පළවා හැරීම සඳහා කාබනික ප්‍රතිකර්ම කිහිපයක් අතරින් එකක් හෝ දෙකක් යොදාගත්හ. ඉන් එක් සුලබ ක්‍රමයක්



වූයේ අළුයම පින්නෙන් තෙමී තිබෙන ශාක මතට ලිපේ අළු ඉසීමය. තවත් ක්‍රමයක් වූයේ වතුරෙහි දිය කළ ගොම ශාක මත ඉසීමය.

තවත් ශිල්පීය ක්‍රමයක් වූයේ " මහපට්ටා" ලෙස සුලබව හැඳින්වෙන ගසේ කොළ හා පොතු පොඩිකර, කොහොඹ සහ ගොරා ගස්වල පොඩිකර ගත් කොළ සමග මිශ්‍ර කර භාවිත කිරීමය. මෙම පොඩිකරගත් ශාක ද්‍රව්‍ය මිශ්‍රණය, ජලය සමග එක්කර සොලවා විශාල බෝතලයක දමා "මේරීම" සඳහා කුඹුරේම තබයි. මෙම ගොවීන්ට අනුව එම මේරීමේ ක්‍රියාවලිය පිනි වැටීමත් සමග සිදුවෙයි. මේරීමට ලක්වූ මෙම අවලම්බනය ඉන්පසුව බෝංචි පැළ මත ඉසිනු ලබයි. මෙම පළිබෝධනාශක ක්‍රමයේ සාර්ථකත්වය මෙම ගම්වාසීන්ගේ එළවළු වගාවන් වෙතින් දැක ගත හැකිය.

සමෝධානික බෝග - පශු සම්පත් ගොවිපල ක්‍රමය

බහුකාර්ය සත්වයකු ලෙස මීහරකා යොදාගැනීම සම්ප්‍රදායික ගොවිපල ප්‍රවේශයකි. මීහරකා වැඩිපුරම භාවිත කරනු ලැබුයේ සී සෑමට සහ ගොයම් පෑගීමට අවශ්‍ය අදින බලයක් ලෙස වුවද වල් පැළ පාලනයට සහ පෙහොර නිෂ්පාදනයට ද උඟ භාවිත කරනු ලැබීය. පොල් වගාවෙහි හානිකර වල් පැළ විශේෂ වන ඉලුක් වැනි වල් ශාක පාලනය කිරීමට ඇති හොඳම ක්‍රමයක් ලෙස, මීහරකුන්ට ඒවා උලාකෑමට සැලැස්වීම පරම්පරා ගණනාවක සිටම දැන සිටින පියවරකි,

පොල් ගසකට පොහොර යෙදීම සඳහා රාත්‍රියක් මීහරක් බානක් එකට ඇදා ගසට බැඳ තැබීම සම්ප්‍රදායයකි. විශාල පොල් වතුවලද මෙය ක්‍රියාවට නැගින. එහිදී වී වගාව සඳහා බිම් සකස් කිරීමට මූලික වශයෙන් මීහරකුන් භාවිත කළ අතර උන්ගෙන් ලත් ද්විතීය ප්‍රයෝජනය වූයේ වල් පැළ පාලනයට එක් කර ගැනීමය.

මෙයට වසර 50 කට පෙර ලුනුවිල පොල් පර්යේෂණාගාරයේ සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂණයක් මගින් සම්ප්‍රදායික ලෙස කාබනික පෙහොර යෙදීම සහ වර්තමාන රසායනික පෙහොර යෙදීම අතර සඵලත්වය සන්සන්දනය කරන ලදී. එහිදී පෙනීගොස් ඇත්තේ ගසට බඳින ලද මීහරකුන් දෙදෙනෙකු (බානක්) විසින් දින දහයක කාලයක් තුළදී සපයනු ලබන නයිට්‍රජන් සහ පොස්පරස් පෝෂක ප්‍රමාණය වසර 2ක කාලයක් සඳහා ගසට අවශ්‍ය එම පෝෂක ප්‍රමාණය සපයන බවය. එනමුත් පොල් වගාව සඳහා අත්‍යාවශ්‍ය තවත් පෝෂකයන් වන පොටෑසියම් සැපයුම එහිදී සිදුවන්නේ ඉතා අඩුවෙනි. නමුත් ගොවීන් විසින් පොල්පැළ සඳහා අතිරේක පෙහොරක් ලෙස කුස්සියේ සෑදෙන ලිපේ අළු භාවිතයට ගනිති. දීර්ඝ කාලයක් තිස්සේ හිස් තෙල් ගැලුම්වලින් සකසා ගත් භාජන 4-5 ක පමණ අළු ප්‍රමාණයක් අතිරේක පෙහොරක් ලෙස පොල් පැළය මුලට යෙදීම සිදුවිය. ලිපේ අළුවල රසායන සංයුතිය බෙහෝසෙයින් වෙනස් වන්නක් වුවද වියලි පොල් ලෙලි (එයත් 25% ක් පමණම පොටෑසියම් ඔක්සයිඩ්ය) සාම්ප්‍රදායිකව ගෙදර ලිපේ ඉන්ධනයක් ලෙස යොදාගැනීම නිසා මෙම අළු පොටෑසියම්වලින් පෝෂිත විය.

සම්ප්‍රදායික ගොවියාගේ පිළිගැනීම වූයේ මෙසේ සැපයෙන මීහරක් අපද්‍රව්‍ය සහ ලිපේ අළු තුළින් වසර 2ක් සඳහා පොල් වගාවට අවශ්‍ය පෝෂක ප්‍රමාණය සැපයෙන බවය.

මෙහිදී වැදගත් වනුයේ නයිට්‍රජන්, පොස්පේට්, සහ පොටෑසියම් යන පෝෂක කාබනික පෙහොර එකතු තුළ පවතින ප්‍රමාණය සහ අනුපාතය වැඩුණු පොලගස් සඳහා, පොල් පර්යේෂණ ආයතනය නිර්දේශ කළ රසායනික පෙහොර තුළ අඩංගු නයිට්‍රජන්, පොස්පේට්, සහ පොටෑසියම් යන ප්‍රධාන පෝෂක ප්‍රමාණයන්ට හා අනුපාතයට සමානවීමටය. එහෙයින් 1960 දශකයේ මුල් කාලයේදීම මෙම සම්ප්‍රදායික කාබනික ගොවිතැන් ක්‍රමය පොල් පර්යේෂණායතනයේ නිල නිර්දේශයක් බවට පත්විය.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවලින් තුරන්වෙමින් පවතින සම්ප්‍රදායික සමාජ සංස්කෘතිකමය දරු ප්‍රසූතිකර්මය

මෙම සමාලෝචනය පදනම්ව ඇත්තේ 1994 මාර්තු මාසයේදී කොළඹදී පවත්වන ලද දේශීය දැනුම සහ තිරසර සංවර්ධනය මැයෙන් වූ සම්භාෂණයේදී වූ "සම්ප්‍රදායක වින්නඹුකර්මය" නමින් ග්‍රාමීය සමාජයේ පැවති සමාජ - සංස්කෘතිකමය සම්ප්‍රදායික දරු ප්‍රසූතිකර්මය තුරන්වීම පිළිබඳව ආර්. එස්. එච්. ප්‍රේමකුමාර සිදුකළ ඉදිරිපත් කිරීම මතය.

මෙම කාර්යයයේදී ප්‍රධාන භූමිකාව සිදු කරනුයේ "වින්නඹුමාතාවය". ඇය දරු ප්‍රසූතිය සඳහා සහාය වීමේ කලාව පිළිබඳ කිසිදු විධිමත් පුහුණුවක් නොලැබූ අයෙකු වුවද තම ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨයකු යටතේ ලද ආධුනික පුහුණුව සහ තමන්ම ලද පෞද්ගලික අත්දැකීම් හරහා මෙම කරුණ පිළිබඳ පවතින සමාජ - සංස්කෘතික සහ ක්‍රියාපටිපාටිය පිළිබඳ මනා දැනුමකින් සහ අවබෝධයකින් යුක්ත වුවාය. අද වෛද්‍යවරු, හෙදියන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්, උපස්ථායකයන් ඇතුළුව මනාව පුහුණුවලත් කණ්ඩායමක් විසින් සිදුකරනු ලබන මෙම බරපතළ කාර්යය සිදුකිරීමට වින්නඹු මාතාව තුළ පැවති හැකියාව පිළිබඳව සමස්ත ප්‍රජාවම ඇය කෙරෙහි තැබූ පිළිගැනීම හා විශ්වාසය වැදගත් ලක්ෂණයකි. මෙම වින්නඹුව සිය සම්ප්‍රදායික කාර්යභාරය ආරම්භ කරනුයේ, ගැබ මේරු සමයේදී නව ආගන්තුකයා පිළිගැනීම සඳහා වන මූලික ලකලෑස්ති වීම් ඇති කරමිනි. මුල්ම කටයුත්ත වනුයේ පහසුකම් රහිත "ප්‍රසූතකාමරය" අතුගා පිරිසිදු කර එහි කහ *(Curcuma domestica)* කුඩු හෝ දියර හෝ ඉසීමෙනි.



මෙමගින් ඇසට නෙපෙනෙන හානිකර බලවේග (භූතදෝෂ) දුරුකිරීමක් සිදුවන ලෙස පෙනුනද, එම කාමරය තුළ විෂබීජ නාශනය කිරීමේ ව්‍යවහාරයක්, ලෙස සැලකිය හැකිය.

ඉන්පසුව ඇය කෙහොඹ *(Aradirachta indica)*, තල *(Sasanum indicum)* සහ එඬරු *(Ricinus communis)* ආදී තෙල් වර්ග මිශ්‍ර තල තෙලක් ගර්භණී මවගේ ඉඟේ සිට ගෙළ දක්වා සෙමෙන් ගල්වනු ලබයි. මෙගින් පේශී සංකෝචනය පහසු කරවන නම්‍යතාවයක් සහ ප්‍රත්‍යස්ථතාවයක් ලැබෙන බව පිළිගැනීමය. සමහර අවස්ථාවලදී ඇය ගර්භිණී මවට දුම්කුඩු ස්වල්පයක් ඉරීමට සලස්වන්නේ බිළිඳා පිටතට තෙරපීමට එය උදව් විය හැකි බැවිනි. දරුප්‍රසූතිය සිදුවන අවස්ථාවේදී, තවත් කාන්තාවන් කිහිප දෙනෙකුගේ ද සහාය ඇතිව මවගේ සිරුරේ රාමුවට ගැලපෙන ආකාරයෙන් මව සිටින ආකාරයට - එනම් ඉරියව් හා ස්ථාන වෙනස් කිරීමටද ඇය ක්‍රියාකරයි.

පෙකනිවැල වෙන්කිරීම සඳහා තියුණු පිහියක් භාවිත කරනු ලබයි. බෙහෝ විට එය තේ ගස් කප්පාදුව සඳහා යොදාගන්නා පිහියක් (සමහර විට කතුරක්) වැනි ආයුධයකි. එය භාවිත කිරීමට පෙර කහදියරයෙහි පොඟවා තැබීම සහ ගිනිදැළුවකට අල්ලා රත් කර ගැනීම සිදුවෙයි. මෙය චාරිත්‍රයක් ලෙස පැවතුන ද එය හින්දු සම්ප්‍රදායට අයත් වුවකි. එමගින් බ්‍රහ්ම (නිර්මාපකයා) විෂ්ණු (ආරක්ෂකයා) සහ ශිව (විනාශකරු) යන අයගේ ආශිර්වාද ලබාගැනීමක් නියෝජනය කරන බව කියයි. එසේම එය වන්ධ්‍යාකරණ ක්‍රියාවලියක්ද වෙයි. තුවාලය මත ඉන්පසුව, ගොම අළු, ගම්මිරිස් සහ වසම්බු *(Acorus calamus)* එකට මිශ්‍රකර තනාගත් ඖෂධීය ආලේපයක් ගල්වනු ලබයි. වැදෑමහ හැලුනු පසු එඬරු තෙල් පානය කිරීමට දෙයි. හැලුනු වැදෑමහ නිවෙසට ඇතුළුවන තැනට පිටතින් වන්නට තබා පිළිස්සීම ඉන් පසුව සිදුකරයි. වදෑමහ මත්තේ ගලක් තබා එය ලණුවකින් බැද එහි අඹ සහ කොහොඹ කොළ එල්ලනු ලබයි. මෙම චාරිත්‍රය මගින් නිවෙසට එල්ල විය හැකි අමනුෂ්‍ය දෝෂ (බැක්ටීරියා සහ විෂබීජ ඇතුළු) වැළැක්වීය හැකි බව විශ්වාස කෙරේ. එසේම මෙම සංකේතය දකින කිසිවෙකු නිවෙසට ඇතුළු නොවන බැවින් එය මව සහ බිළිඳාගේ ස්වස්ථතාව සහ සනීපාරක්ෂාව තහවුරු කරන්නට ආධාර වන්නක් ලෙසද සැලකිය හැකිය. මෙම සත්කාරය දින 30ක පමණ කාලයක් තිබෙන්නට හරින අතර එම කාලය තුළදී වින්නඹු මාතාව සහ ඇයට උදව් දෙන වැඩිහිටි කාන්තාවන් බිළිඳාගේ සහ කිරිදෙන මවගේ සත්කාර සැපයීම සිදු කෙරෙයි.

අවසාන වශයෙන් මාසයක කාලයක් පුරා සැපයෙන, පසු - ප්‍රසව සත්කාර සමය ආහාරමය කළමනාකරණය, ප්‍රාථමික සෞඛ්‍ය සත්කාරය, පවිත්‍රකරණය සහ චාරිත්‍රමය හෝ අධ්‍යාත්මික හෝ යන සත්කාර

සැපයීම තුළින් මහඟු කාර්යභාරයක් ඉටුකෙරෙයි. මෙම සමය අවසානයේදී මව සහ නව ජන්මයා හට ප්‍රජාව වෙත පිවිසීමේ අවස්ථාව සැලසෙයි.

සෙංගමාලය (හෙපටයිටිස්/කාමලාව) සඳහා වන ප්‍රත්‍යක්ෂ සම්ප්‍රදායික ප්‍රතිකාරය

1994 දී පැවැත්වූ දේශීය දැනුම පිළිබඳ සාකච්ඡා සමුළුවට පී. සේරසිංහ ඉදිරිපත්ව කළ පත්‍රිකාව මගින් දේශීය වෛද්‍ය ආයතනය විසින් පුස්කොළ පොත් තුළින් ලද තොරතුරු විශ්ලේෂණය කරමින් සිදු කරන කාර්ය මෙසේ විස්තර කෙරින.

පුස්කොළ පොත් 158ක් අධ්‍යනය කර ඇති අතර කාමලාව ලෙස වෛද්‍ය සාහිත්‍යයේ සඳහන් රෝග තත්වයට තනි ඖෂධ ලෙස භාවිත කළ ශාක විශේෂ 8ක් හඳුනා ගනු ලැබ ඇත. මෙම රෝග තත්වය සෙංගමාලය හෝ කහ උණ හෝ වශයෙන්ද හඳුන්වා තිබේ. හෙපටයිටිස් හෝ කාමාලාව ලෙස හැඳින්වෙන හෝ විවිධ මට්ටම්වල *හෙපටික් නෙක්රෝසියාව* (විපත්‍යය) තත්වයක් අක්මාවේ ඇති කරනු ලබන වයිරස ආසාදනයවෙයි. ඒ සඳහා වන වර්තමාන ප්‍රතිකාරයට ඇඳ විවේකය, දියර වැඩිපුර ගැනීම, ග්ලූකොස් හා බී විටමින ගැනීම සහ ආහාරමය ප්‍රතිකර්මය ඇතුළත්ය.

දේශීය වෛද්‍යවිද්‍යාවේ වැඩිපුරම සිදුවන්නේ ශාක සහ බත් මිශ්‍රිත කොළ කැද ලබා දීමය. එහිදී වඩා සුලබව ලබාදෙන කොළ වර්ගය වන්නේ *(Osbeckia octandrea)* හෙවත් හීන්බෝවිටියා ලෙස මෙරට හැඳින්වෙන දම් - නිල් පැහැ පුංචි මල් සහිත කුඩා ශාකයය. එය පහතරට, විශේෂයෙන්ම කුඹුරු ආශ්‍රිතව ඉතා සුලබව දැකිය හැකිය.

ඉන්පසුව ස්වාභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය විසින් රුහුණු සරසවියෙහි සී පතිරණ ඇතුළු පර්යේෂකයන් කණ්ඩායමකට "ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ බෙහෙත් පැළෑටි" අධ්‍යයනය ලෙස නම් කළ ව්‍යාපෘතියක් මගින් හීන්බෝවිටියා ද ඇතුළත් ශාක වර්ග හයක රසායනික පරීක්ෂණය පවරනු ලැබීය. මෙම අධ්‍යයනයේදී "ඔස්බෙනියා ඔක්ටැන්ඩා" නැතිනම් හීන්බෝවිටියා පත්‍ර අනුක්‍රමික මෙතොනොලිත නිස්සාරණයට ලක්කිරීමෙන් පසු ලද නිස්සාරණය රසායනිකව පරීක්ෂණයට ලක් කරනු ලැබීය. මෙම නිස්සාරණය තුළින් සංයෝග තුනක් හඳුනාගනු ලැබූ අතර ඉන් එකක් ප්ලෙවනොයිඩ තුනක මිශ්‍රණයක් විය. සක්‍රිය නිස්සාරකවලින් ලද නිෂ්පාදන CCl_4 නික්ෂේපණයක් ලබාදීම මගින් ප්‍රේරණය කළ අක්මා හානි සහිත "ස්ප්‍රේග් ඩෙව්ලේ" (Sprague Dawley) මාදිලියේ පිරිමි ඇලිමීයන් තුළ ඇන්ටි හෙපටෝටොක්සන් (ප්‍රතියාකෘතික බහුලතාව හෙවත් අක්මාවේ සෛල තුළ විෂ තත්වයන්ට එරෙහි වීම) ක්‍රියාකාරීත්වයට සහ අක්මා අක්‍රියකාරීවීම් තක්සේරුව සඳහා යෙදා ගනු ලැබිණ. වැළැක්වීමේ අංශයෙන් බලන විට මෙම සංයෝග තුන සක්‍රිය බව පෙනී ගොස් ඇත. මෙම අධ්‍යනය අවසන් ප්‍රතිඵල නිගමනය නොකළ ද හීන්බෝවිටියා පත්‍ර නිස්සාරක තුළ හෙපටයිටිස් රෝගයෙන් ආරක්ෂාව සලසන හෝ හෙපටයිටිස් රෝග ය වළක්වන හෝ රසායනික කාරක පවතින බව හෙළිදරව් විය.



ගවයින්ගේ රෝග නිරීක්ෂණය කිරීමේ දේශීය ක්‍රම

වසර 150ක් තරම් පැරණි පුස්කොළ පොත් පරීක්ෂා කිරීමෙන් පසුව 1994 දී පැවති දේශීය දැනුම සම්භාෂණාව සඳහා ටී. එන්. ජයතිලක සිදුකළ ඉදිරිපත් කිරීමක් තුළින් ගවයාට ඇතිවන රෝග නිරීක්ෂණය සහ ප්‍රතිකාර කිරීමේ දේශීය ක්‍රමයක් පිළිබඳව විස්තර කෙරින. මෙම ප්‍රතිකාර දර්ශනය තුළ ගැබ් වූ එක් විශේෂිත අංශයක්වූයේ ගවයන් 'ගෝත්‍ර' ලෙස හැඳින්වූ ඔවුන්ගේ පෙළපත අනුව වර්ගීකරණය කිරීමය. එය එහි මුල් පියවර ලෙස සැලකුණු. කිසියම් රෝග වර්ගයකට පවතින ග්‍රහණශීලි භාවිතය පිළිබඳ හැඟීමක් ලබාදීමට ගෝත්‍රය හරිහැටි හඳුනාගැනීම මගින් හැකියාව ලැබෙන බව එහි අදහස විය.

රෝගය හඳුනාගැනීම සිදුවූයේ දෘෂ්ටිමය නිරීක්ෂණ සහ කලයාත් සමග පරීක්ෂණයට ලක් වූ දේශීය දැනුම ඇතුළත් වූ ගැඹුරු සායනික අත්දැකීම් ඔස්සේය. රෝගී සත්වයාගේ හැසිරීම, නාඩි වේගය, ශ්වසනය, හොම්බේ වියළි බව, වමාරා කන ස්වභාවය, ගොම පහ කිරීම, මුත්‍රා කිරීම, සචලවීම, කන් පවතින ඉරියව්ව, අස්වල වෙනස්වීම් සහ රතුවීම, අක්ෂි ගෝලයේ චලනය, කඳුළු ගැලීම, නාසයෙන් ස්‍රාව ගැලීම, ගැබ්බර වීම, පැටියාට කිරිදීම ආදී ලක්ෂණ පරීක්ෂා කිරීමෙන්, සහ රෝගී සත්වයා සුපරීක්ෂාවෙන් නිරීක්ෂණය කිරීම පදනම්ව රෝග නිරීක්ෂණ සහ ප්‍රතිකාර කිරීමේ කුසලතා හිමිකරගැනේ.

වෛද්‍යවරු මෙහිදී භාවිත කළ ප්‍රතිකාර තන්ත්‍ර තුළ වැදගත් අංගයක් වූයේ ජෛව භෞතික සහ අධ්‍යාත්මික වෛද්‍ය අංශ ඒකාබද්ධව එය සිදු කිරීමය. ජයතිලක විසින් වාර්තා කරන ලද පරිදි අධ්‍යාත්මික වෛද්‍ය ප්‍රතිකර්ම භාවිතය වසංගතවේදීය වශයෙන් වැදගත් වූ දියුණු ක්‍රමයක් විය. එසේම එය ඇස් පනාපිට පෙනෙන ඉක්මන් සුවයක් හෝ බෝවන රෝගයක් ප්‍රතිකාර කිරීමේ හෝ බෝවීම වැළැක්වීම සඳහා වූ පියවරක් ලෙස සැලකෙයි. සත්වයන් අධ්‍යාත්මික වෛද්‍යයට ලක් කිරීම සහ / හෝ කෙටිකාලීන නිශ්ඵල කිරීම සඳහා සිදු කළ විෂ කිරීම් යනාදිය පැහැදිලි ලෙස සම්පූර්ණ වශයෙන් අවබෝධ කරගැනීම නොහැකි වූ

අංගයන්ය. පශු සම්පත් පට්ටි සඳහා ආශිර්වාද පළකිරීම පිණිස රටේ විවිධ පළාත්වල වාර්ෂික පුද පූජා චාරිත්‍ර විධි ද සම්ප්‍රදායිකව සිදු කෙරින. එමගින් බෝවන රෝග කාරක ඇතුළුවීමක් හෝ පැතිරයාමක් හෝ සිදුවීම වළක්වාලීම අත්‍යාවශ්‍ය. මෙහිදී ජයතිලක දක්වන එක් උදාහරණයක් වුයේ මොණරාගල දිස්ත්‍රික්කයේ මීහරකුන් සඳහා පැවැත්වූ *මන්ගාර* නම් පූජා චාරිත්‍රයය. මෙයට අමතරව යන්ත්‍ර, මන්ත්‍ර සහ කෙම් ආදිය භාවිතයෙන්ද භූත දෝෂ වලින් (අදෘශ්‍යමාන උපද්‍රවයන්ගෙන්) සතුන් ආරක්ෂා කිරීමට පියවර ගැනීමත් සිදුවිය.

පුරාතන රෙදි සහ ඇඳුම් කර්මාන්තය

පැරණි යුගයේ දී කඳුකර ප්‍රදේශවල භෝග වගාවක් ලෙස කපු වගාව සිදු කර ඇත. කඳුරටින් අනුරාධපුර ප්‍රදේශයට අලෙවි කළ එක් ප්‍රධාන වෙළඳ භාණ්ඩයක් වූයේ එයයි. හේනෙන් එකතු කරගන්නා කපු වියලා පිරිසිදු කිරීම සිදු වූයේ ගෘහ පරිසරයේදීය. කපු ඇට ඉවත් කිරීම සඳහා එය යන්ත්‍රයක ආධාරයෙන් මෙසේ කපු පිරිසිදු කර සකස් කිරීම සිදු කරනු ලැබීය. රෙදි විවීම සඳහා සුදුසු නූල් සකස් කරගනු ලැබුයේ පුලුන්වලට පොල්ලකින් තලා පසුව හුළං කිරීම සහ රෝල් කිරීම මගිනි. කපු විවීම සඳහා කාන්තාවන් රාශියක් එකට එකතුව කටයුතු කළ අතර ඔවුහු තම කාර්යයෙහි නිරත වූයේ ජාතක කතා පදනම් කරගත් තෝරාගත් ජනකවි ගායනා කරමිනි.

රෙදි විවීම සඳහා භාවිත කළ යන්ත්‍ර සහ ශිල්ප ක්‍රමය ඉන්දියාවේ සහ මියන්මාරයේ (බුරුමයේ) ඒ සඳහා භාවිත කළ යන්ත්‍ර පරිදිම විය. 'අලුව' යන නමින් රෙදි වියනය හැඳින්වුන අතර, එය 'ඇල්ගේ' නමින් හැඳින් වූ රෙදිවියන නිවස්නයට සවිකර තිබිනි. එම නිවස්නය විවෘත කුටියකි. රෙදි වියමනේදී නූල් හැදෑයෙන් එකක් ඇර එකක් ආදී වශයෙන් නූල් තෝරා දීම නඩාවෙහි රැහැන් මගින් සිදුවන්නේ නඩාව ඒ පැත්තෙන් මේපැත්තට සහ මේපැත්තෙන් ඒ පැත්තට චලනය වීමේදීය. රෙදි වියනය අවශ්‍ය චලනය පයින් පාගන ලීවරය (ට්‍රෙඩලය) මගින් ලබා දෙයි.

එකල වියන ලද රෙදිපිළි අද මෙන් සැලැස්මකට කපා මසා නිම කරන ඇඳුම් නොවේ. එය රෙදි වියනයෙන්, අලුවෙන් ලැබෙන්නේ සමතුරණයෙන් නිමවූ රෙද්දක් හෝ අඳුමක් ලෙසය. එහෙයින් ඉන් ලැබෙන නිමා වූ රෙදි විවිධ ප්‍රමාණයෙන් හැඩයෙන් සහ මෝස්තරවලින් යුක්තය. මෙම බොහෝ ඇඳුම් වර්ග අතර පිරිමි ඇඳුම්, කාන්තා ඇඳුම් නායකයන් සඳහා ඇඳුම් මෙන්ම තුවා, අත්පිස්නා, ෂෝල් ලේන්සු, ඇඳ ඇතිරිලි ආදිය ද පවතියි. රෙදි අඳින කුල ගෝත්‍රයන්ට අනුවද ඇඳුම්වල සැලසුම් නිගමනය වන බව (ලක්දු සිංහ, 1999 විදුරාව 19 (1) පිටු 20-25) අවස්ථා ද ඇති බව පවසයි.

ශ්‍රී ලංකා ස්භාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරියේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
එම්. අසෝක ටී. ද සිල්වා
0775097517

නව නිපැයුම් ගවේෂකයෝ

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් දීප ව්‍යාප්ත පාසල් නව නිපැයුම්කරුවන් සොයා යන ගමනේ එක් පියවරක් ලෙස මෙම තරඟාවලිය සූදානම් කරනු ලබයි. දිවයිනේ සියලුම පාසල්වල වයස අවුරුදු 11 සිට 18 දක්වා දරුවන් වෙනුවෙන් කාණ්ඩ දෙකක් යටතේ මෙම තරඟාවලිය විවෘත වේ.

තරඟයේ ස්වභාවය: එදිනෙදා ජීවිතයේදී බලපාන ගැටළුවක් ඉදිරිපත් කරනු ලබන අතර ඊට ගැලපෙන තාක්ෂණික විසඳුමක් නිර්මාණාත්මකව රචනා කොට අප වෙත එවිය යුතුය.

තරඟය කාණ්ඩ දෙකකින් සමන්විත වන අතර සියලුම නිර්මාණාත්මක රචනා විදුහල්පති සහතිකය සමඟ ඉදිරිපත්කළ යුතුය. විදුහල්පති සහතිකය නොමැති විසඳුම් කොමිසම විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිර්මාණාත්මක රචනා සඳහා රූප සටහන් භාවිතා කළ හැකි අතර ඔබගේ නිර්මාණාත්මක විසඳුම A4 කඩදාසි දෙකකට සීමා විය යුතුය.

වයස අවුරුදු 11 සිට වයස අවුරුදු 15 දක්වා කාණ්ඩය

වගාවන්ට හානි කිරීමට පැමිණෙන කුරුල්ලන් පලවා හැරීමට පහසු ක්‍රමයක් ඇටවුමක් නිර්මාණාත්මක රචනාවක් ලෙස ඉදිරිපත් කරන්න.

වයස අවුරුදු 16 සිට වයස අවුරුදු 18 දක්වා කාණ්ඩය

විදුලිය පිරිමසා ගනිමින් කාර්යක්ෂමව ආහාර කල් තබා ගැනීමේදී ශීතකරණයක් වෙනුවට භාවිතයට ගතහැකි ආදේශකයක් නිර්මාණාත්මක රචනාවක් ලෙස ඉදිරිපත් කරන්න.

මෙම තරඟාවලියේ කාණ්ඩ දෙකෙහිම පළමු, දෙවන හා තෙවන ස්ථාන ලබාගන්නා ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග හා සහතිකපත් පිරිනමනු ලබන අතර වසර අවසානයේ පවත්වනු ලබන **"සහසක් නිමැවුම්"** ජාතික නව නිපැයුම් සම්මාන ප්‍රදානෝත්සවයේදී විශේෂිත සහතික පත්‍රයක් පිරිනැමීමට කටයුතු කරනු ලබයි.

ඔබගේ සියලුම නිර්මාණාත්මක රචනා

නම: .....

පාසැල: .....

ඉගනුම ලබන ශ්‍රේණිය:.....

විදුහල්පති සහතිකය සමගින් පහත ලිපිනයට අප වෙත එවන්න. ලියුම්කවරයේ වම්පස කෙලවර **"නව නිපැයුම් ගවේෂකයෝ"**යනුවෙන් සඳහන් කරන්න.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
අංක 525
යුනියන් පෙදෙස
කොළඹ 02
දුරකතන අංක :0112676645
ෆැක්ස් අංක : 0112676646

ශ්‍රී ලංකාවේ දේශීය වාස්තු විද්‍යාව

මහාචාර්ය නිමල් ද සිල්වා



යම් ශිෂ්ටාචාරයක් විසින් විදහා දක්වනු ලබන ගෘහනිර්මාණ ශිල්පය මගින් එකී ශිෂ්ටාචාරය ගෞරවයකට හා පිළිගැනීමකට ලක් කරනු ලබයි. ගෘහනිර්මාණ ශිල්පය, එහි නිර්මාපකයන්ගේ කලාත්මක හැකියාවන්, ඔවුන්ගේ විශ්වාසයන්, අභිලාෂයන්, ඔවුන් ලද තාක්ෂණික ජයග්‍රහණ, ඉතිහාසයෙහි විවිධ අවධිවල මුහුණ පෑමට සිදුවූ බලපෑම්, යනාදී බෙහෝ තොරතුරුවල කෝෂ්ඨාගාරයක් සකසයි. ඕනෑම ඓතිහාසික ගොඩනැගිල්ලක් පුස්තකයක් බඳුය. එය ගොඩනගනු ලැබූ සහ භාවිත කරන ලද සමාජයෙහි විවිධ දෘෂ්ටීන් එහි පරිච්ඡේද ලෙස කියවිය හැකිය. ඕනෑම ශිෂ්ටාචාරයක ගෘහනිර්මාණ ශිල්පය, එකී ශිෂ්ටාචාරයෙහි හෝ සමාජයෙහි හෝ අභිමානයට වේදිකාවක් සපයයි.

ශ්‍රී ලාංකීය ගෘහනිර්මාණ ශිල්පය, ආගමික ගෘහනිර්මාණ ශිල්පය, ලෞකික ගෘහනිර්මාණ ශිල්පය, සහ ගැමියන්ගේ ගෘහනිර්මාණ ශිල්පය ලෙස තෙවැදෑරුම් මාතෘකා ඔස්සේ සලකා බැලිය හැකිය. චිරකල් පැවැත්ම සහ උත්කෘෂ්ටභාවය නිරූපණය කෙරෙන ආකාරයට ආගමික ගෘහනිර්මාණ ශිල්පය නිර්මිත වූ අතර ඉතිරි දෙවර්ග මගින් රාජකීය මාලිගා, ඉහළ පැලැන්තියේ වාසස්ථාන, රජයේ ගොඩනැගිලි වැනි අභිමානවත් නිර්මාණ සහ විවිධ ආකාරයේ ගැමි ගෙවල් ආවරණය කෙරුණි. ගෘහනිර්මාණ ශිල්පය දිගුකාලීනව පවත්වාගෙන යෑමේ ක්‍රියාවලිය සහ ඒවායේ කාලානුක්‍රම විකසනය, ඓතිහාසික කාලවකවානුවලදී ලබාගත් විවිධ ජයග්‍රහණ, සහ ඒවායේ ප්‍රතිඵලය වූ බලපෑම්, ගෘහනිර්මාණ ශිල්පය තුළ ප්‍රකාශ වීම සිත් ගන්නා සුළුය, ශ්‍රී ලංකාවේ දේශීය ගෘහනිර්මණ ශිල්පය, අප රටේ ඓතිහාසික කාලපරිච්ඡේද තුළ ගොඩනගන ලද බොහොමයක් මහා ප්‍රාසාදවල නටඹුන් තැන්පත් කර තබමින් වසර දෙදහස් දෙසීයකට අධික කාලයක් නෙනැසී අඛණ්ඩව පවත්වා ගෙන ගොස් තිබේ.

ශ්‍රී ලංකාව තුළ ගෘහනිර්මාණ ශිල්පීය වෘත්තිය ඉතා වැදගත් සුවිශේෂී තනතුරක් ලෙස සලකනු ලැබූ අතර එනිසාම, විවිධ කාලවකවානුවල වූ වාස්තු විද්‍යාත්මක සිද්ධාන්ත, මූලධර්ම සහ ව්‍යවහාර පැහැදිලි කරමින් පාඨග්‍රන්ථ සම්පාදනය කරනු ලැබ තිබේ. සිල්ප පාඨ මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර යනු ක්‍රි. පූ. 5වන සියවසෙහි සම්පාදනය කරන ලද එවැනි වැදගත් වාස්තු විද්‍යාත්මක පාඨ ග්‍රන්ථයකි. මෙම වාස්තු විද්‍යාත්මක ග්‍රන්ථය බෞද්ධ ආශ්‍රම සැලසුම් කිරීම සහ ගොඩනැගීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ලබා දෙන අතර අධ්‍යාත්මික ආකල්පයක් ලබා දෙනු වස් එයට බෝධිසත්ව මංජු ශ්‍රී යන නම ආරෝපණය කරන ලදී. ශ්‍රී ලංකාවේ බෞද්ධ ආශ්‍රමවල හමුවන සෑම ආකාරයකම ගොඩනැගිලිවල, ඒවා ගොඩනගන ලද ආකාර, පසුබිම සහ පසුතල පිළිබඳව මෙම ග්‍රන්ථය මගින් පැහැදිලි කෙරේ. බෞද්ධ ආශ්‍රමවල හමුවන වැදගත් පූජනීය ගොඩනැගිලි පහ, එනම්, ස්ථූපය, ප්‍රතිමා ගෘහය (පිළිම ගෙය), බෝධිය (බෝධිඝරය), විහාර ගෙය (උපෝෂිතාගාරය) සහ බණ මඩුව (සභා) පිළිබඳව මෙම ග්‍රන්ථය විස්තර කරයි. උදාහරණයක් ලෙස, බුබුළක හැඩය (බුබුළාකාර), කළයක හැඩය (ඝටාකාර), ධාන්‍යගොඩක හැඩය (ධාන්‍යාකාර), ඝන්ටාරයක හැඩය (ඝන්ටාකාර), නෙල්ලි ඵලයක හැඩය (ආමලාකාර), නෙළුම් හැඩැති (පද්මාකාර) සහ ඵනු ගෙඩියක හැඩය (පලන්ද්වාකාර) යන ලෙස ස්ථූප ආකාර හතකට (07කට) ගොඩනගන බව මෙම ග්‍රන්ථයෙහි සඳහන් වේ.

මෙම පාඨ ග්‍රන්ථ මගින් සැලසුම්, පසුතල, දැනුම යනාදිය පිළිබඳ තොරතුරු සම්පාදනය කිරීම පමණක් නොව ගොඩනැගිල්ලට අධ්‍යාත්මික බැඳීමක් ලබා දෙන සිද්ධාන්ත තීරණය කරනු ලබන ආගමික - සංස්කෘතික විශ්වාස පිළිබඳ තොරතුරු ද සපයයි. මෙම වාස්තු විද්‍යා සිල්ප ග්‍රන්ථය නොමැතිව අනුරාධපුරයේ හමුවන ආශ්‍රම ගොඩනැගිලි විස්තර කිරීමට සහ වටහා ගැනීමට අපහසු වන්නට ඉඩ තිබුණි.



මිරිසවැටිය චෛත්‍යය

ශ්‍රී ලංකාවේ දේශීය ගෘහනිර්මාණ ශිල්පය, සම්ප්‍රදාය සහ දේශගුණයට දක්වන ප්‍රතිචාරය, වටපිටාවේ පවතින ද්‍රව්‍ය භාවිතය, සැලසුම් කිරීම සහ නිර්මාණශීලිත්වය, සෞන්දර්යය, අනුපාත සහ සංයුතිය, භූ ලක්ෂණ භාවිත කිරීම, පාෂාණ සහ පර්වත, ජලයට ප්‍රතිචාර දැක්වීම, තාරකා විද්‍යාත්මක විශ්වාස, සහ ආගමික - සංස්කෘතිකමය විශ්වාස යනාදී පැතිකඩ කිහිපයකින් සමන්විත වේ. ගොඩනැගිල්ලෙහි උපයෝගිතාවයට අමතරව එය භාවිත කරන්නාගේ සෞභාග්‍යය, කල්පැවැත්ම සහ සෞන්දර්යාත්මක බව යනාදියට ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. ඉදිකිරීම් සිදු කරන විට ඒ හා සම්බන්ධ පිළිවෙත් ක්‍රම පිළිබඳව දැනුවත්භාවයක් සහිත පූජකයෙකු ලෙස ගෘහනිර්මාණ ශිල්පයා සලකනු ලැබුණි. වඩු කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය, ගොඩනැගිලි ද්‍රව්‍ය, ඉදිකිරීම් තාක්ෂණය සහ තාරකා විද්‍යාත්මක විශ්වාස, යනාදිය පිළිබඳව ගෘහනිර්මාණ ශිල්පියා මනා ලෙස දැන සිටියේය. සම්ප්‍රදාය තුළ සියලුම නිර්මාණ, සැලසුම්, ශිල්ප සහ ඉදිකිරීම්වල භාරකාර දේවතාවා ලෙස විශ්වකර්ම දෙවියන් පූජනීයත්වයට එක්ව තිබේ. එනිසා අහස උසට නැගි ගොඩනැගිලි විශ්වකර්ම දෙවියන්ගේ අශීර්වාදය සහිතව නිර්මාණය වූ දිව්‍යමය නිපැයුම් ලෙස සලකනු ලබයි. ගෘහනිර්මාණ ශිල්පය උගන්වනු ලැබුවේ ගුරු - ගෝල සම්ප්‍රදායට වන අතර එය බොහෝ විට විශේෂ ශිල්පී සමාජයකට හෝ කුලයකට හෝ සීමා කෙරුණි. තම ගුරුතුමා සමග සමීපව ඇසුරු කිරීම මගින් හෝ වැඩ කටයුතු කිරීම මගින් හෝ මෙන්ම ශිල්ප ග්‍රන්ථ අනුගමනය කිරීම මගින් ගෘහනිර්මාණ ශිල්පීය විෂය හැදෑරීම සිදු කළේය.

ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යාත්මක ඉතිහාසයේ වඩාත් කැපී පෙනෙන බලපෑම සිදු කෙරුණු සාධකය වූයේ ක්‍රි. පූ. 247දී ඉන්දියාවේ රජ කළ අශෝක අධිරාජයා විසින් බුදුදහම විධිමත් ලෙස අප





රටට හඳුන්වා දීමය. එනමුදු, ක්‍රි. පූ. 6වන සියවසේ දී ආර්ය ආගමනය සිදු වූ ශ්‍රී ලංකාවේ පෙර සිට පදිංචිව සිටි අනාර්යයන් විසින් පුරාණ අනුරාධපුර නගරයේ බෙර (මෘදංග) සැලසුමේ ආකාරයට සකසනු ලැබ තිබුණි. තවද, මලවුන්ගේ අලු තැන්පත් කර විශාල ගල් පුවරු භාවිත කරමින් ගොඩනගා ලද ප්‍රාග් - ඓතිහාසික කෝෂ්ඨ සුසානාගාර විශාල සංඛ්‍යාවක් සහ ජලය ලෙන් ගුහාව තුළට වැස්සීම වළකාලීම පිණිස පියස්ස මුදුනෙහි කටාරම් කපන ලද ලෙන් ගුහා බොහෝමයක් තිබුණි.

අනුරාධපුර යුගයෙහි ගෘහනිර්මාණ ශිල්පය

ශ්‍රී ලංකාවේ අගනගරය ලෙස අඛණ්ඩව වසර එක්දහස් තුන්සියයකට අධික කාලයක්, එනම් 11වන සියවස වන තෙක් පැවතුණු අනුරාධපුර නගරය පුරා ආගමික සහ ආශ්‍රම ගොඩනැගිලි විශාල සංඛ්‍යාවක් තම ආධිපත්‍ය පතුරුවා තිබුණි. ක්‍රි. පූ. 3වන සියවසේ දී ශ්‍රී ලංකාවට පිළිස්සූ ගඩොල් තාක්ෂණය හඳුන්වා දීමෙන් වසර සියයක කාලයක් තුළ සිංහලයෝ ලොව උසම ගඩොල් ගොඩනැගිලි; ස්ථූප නිර්මාණය කළහ. මේවා, බුදුවරුන්ගේ ශරීර ධාතු තැන්පත් කෙරුණු, සතරැස් ගල් අතුරන ලද වේදිකාවක් මත තබන ලද ඝන ගෝලාර්ධයක් සහිත, අකුණු සන්නායකයක් ලෙස කටයුතු කරන මැණිකක් ඇති, කොතක් ලෙස කෙළවර වන මධ්‍ය දඟරයකින් සමන්විත වන පූජනීය ගොඩනැගිලි ලෙස හැඳින්විය හැකිය. මල්කම් සහ ජ්‍යාමිතික රටාවලින් අලංකාර කරන ලද විශාල පියගැට සහිත දොරටු පූජාසන සතරට මුහුණලා සතර දිශාවෙහි වේදිකාව දෙසට වන ලෙස සකසන ලද විශාල පියගැට සහිත දොරටු, කැටයම් කරන ලද සතුන්, මල්කම් සහ ජ්‍යාමිතික රටා මගින් අලංකාර කොට ඇත. ආශ්‍රමයක ඉස්මතුව පෙනෙන වාස්තු විද්‍යාත්මක ගොඩනැගිල්ල ස්ථූපයක්

මගින් නිරූපණය වන අතර එහි ගෝලාර්ධයේ උස මීටර 2 සිට 150 දක්වා වෙනස් වේ. අනුරාධපුරයේ පිහිටි මෙකී ආශ්‍රම භික්ෂූන් 5000ක් පමණ අධ්‍යාපනය ලද ජේතවනය සහ අභයගිරිය වැනි විශාල විශ්වවිද්‍යාල මෙකල පැවතුණි. මහාවිහාරයෙහි සහ මිරිසවැටියෙහි භික්ෂූහූ 3000ක් පමණ වූහ. දෙමහල් භික්ෂු වාසස්ථාන, පිළිම ගෙවල්, රැස්වීම් ශාලා, මුළුතැන් ගෙවල්, පොදු භෝජන ශාලා, උණු දිය නාන තටාක, පානීය ජල සැපයුම්, නාන තටාක සිය ගණනක් සහ ආශ්‍රමයෙහි අවශ්‍යතා සපුරාලන වෙනත් බෙහෝ ගොඩනැගිලි සහිතව මනා ලෙස සැලසුම් කරන ලද සැකසුම් එහි විය.



ජේතවනාරාම චෛත්‍යය

මීටර් 200ක් පමණ වූ පර්වතයක් අයුරින් නිර්මිත, සියල්ලට ඉස්මතුව පෙනෙන රාජකීය පරිශ්‍රයකින් සමන්විත 5වන ශතවර්ෂයේදී නිර්මාණය කරන ලද භූමිදර්ශන සහිතව සකසන ලද සවිමත් රැකවල් සහිත සීගිරිය, අද්විතීය නිර්මාණයක් වන අතර වර්තමානයේ දී එය ලෝක උරුමයක් ලෙස සලකනු ලබයි. ශ්‍රී ලාංකීය ගෘහනිර්මාණ ශිල්පය බොහෝ විට භූමිදර්ශන මූලික ගෘහනිර්මාණ ශිල්පයක් වන අතර එය ආක්ෂීය සැකසුමක් හා සම්බන්ධ සමවාය ආකාරයකට, භූ දර්ශනයේ විවිධ ස්තරවලට, ස්වභාවික ගල්පර හා පාෂාණ, පියගැට පෙළ, විවිධ හැඩගත් පොකුණු, ගලා යන ජලය, පාෂාණ, පියගැට පෙළ, විවිධ හැඩගත් පොකුණු, ගලා යන ජලය, විවිධ වර්ගවල වෘක්ෂ සහ ශාකවලින් ලද සෙවණ යනාදියෙන් සමන්විත වේ. සීගිරිය යනු ස්වභාවික පරිසරය විද්‍යානුකූලව සංරක්ෂණය කිරීමේ සංකල්ප හැකිතාක් දුරට සාධ්‍ය කිරීම පිළිබඳව වටහා ගැනීමක් සහ සහතික කිරීමක් සහිතව බොහෝදුරට රාජකීයයන් සඳහා තනන ලද විනෝද උද්‍යානයක්වේ. එහි බටහිර දෙස පාෂාණ පෘෂ්ඨය මිනිසා විසින් තනන ලද විශාලතම බිතුසිතුවම් සමුච්ඡය දරා සිටී. රාජකීය ලලනාවන්ගේ අලංකාර සිතුවම් 600ක් පමණ මීටර් 100 යි මීටර් 30ක් වූ ක්ෂෙත්‍රඵලයක් ආවරණය කරයි. වසර 1500කට පමණ පෙර තනන ලද සීගිරියෙහි පියගැට පෙළ සමඟ එහි පාෂාණ පෘෂ්ඨය ඔස්සේ තනා තිබෙන සීගිරියේ කැටපත් පවුර දිගු කාලයක් තිස්සේ හිරු එළියට සහ වර්ෂාවට පාත්‍ර වුවද එහි පරාවර්තන පෘෂ්ඨය ද සමග එය ඒ ආකාරයෙන්ම පවතිනු දක්නට ලැබේ. මෙම කැටපත් පවුර ක්‍රි.ව. 6 වන සියවසේ සිට 14 වන සියවස දක්වා සීගිරිය නැරඹීමට පැමිණි දහස් ගණනක් වූ සංචාරකයින්ගේ අත් අකුරු තැන්පත් කෙරෙමින් සීගිරි අප්සරාවන්ගේ සහ තුරු අතරින් දකින දසුනෙහි සුන්දරත්වය අගයමින් ලියන ලද කුරුටු ගීවලින් සමන්විතය.

භූමිදර්ශනය, ජලය සහ නිර්මිත පරිසරය එකිනෙක හා බද්ධ කරවමින් සීගිරිය තනන ලද කාශ්‍යප රජතුමා විසින්ම අනුරාධපුරයෙහි වෙස්සගිරිය ආශ්‍රමය සහ රාජකීය සතුටු උයන වන රන්මසු උයන නිර්මාණය කරන ලදී. වාස්තු විද්‍යාත්මක සම්ප්‍රදායයෙහි අංගයක් ලෙස ආගමික නොවන සියලුම ගොඩනැගිලිවල සැරසුම් අංග ලෙස ගල් කැටයම් සහ බිතුසිතුවම් භාවිත කෙරුණි. ගෘහනිර්මාණ ශිල්පීය කටයුතුවල සැරසිලි සංකල්පය, පිවිසුමෙහි ඇති අර්ධකවාකාර පියගැට පෙළක් වන සඳකඩ පහණින් ආරම්භ වී, පියගැට පෙළ ඔස්සේ කොරවක් ගල්, කුලුනු, වහල මස්තකයේ සවි කොට ඇති කොත දක්වා ඉහළ නගින කුලුනු හිස දක්වා ගෙන ගොස් තිබේ.

පොළොන්නරු සමය තුළදී ගෘහ නිර්මාණ ශිල්පය (ක්‍රි.පූ. 11 සිට 12 වන ශත වර්ෂය දක්වා)

පොළොන්නරුව සමයට අයත් වූ සියවස් දෙක තුළ මහා ස්ථූප, පිළිම ගෙවල්, දළඳ මාලිගා සහ මාලිගා ගොඩනැගිලි ඇතුලු වාස්තු විද්‍යාත්මක විසල් ගොඩනැගිලි බිහි විය. අනුරාධපුර සමයෙහි මෙන් නොව පොළොන්නරු යුගයට අයත් නිර්මාණවල පරිමාණය සහ විශාලත්වය පෙන්නුම් කරමින් අදටත් පවතින ගඩොල්



සීගිරිය

ගොඩනැගිලි විශාල සංඛ්‍යාවක් ඉදිවිය. භික්ෂූන් වහන්සේලා රැස්වෙන ශාලාවක් /වාසස්ථාන ගොඩනැගිල්ලක් වන බද්ධ සීමා

ප්‍රාසාදය මහල් දොළොසකින් සමන්විත වූ අතර මහ පැරකුම් නිරිඳුන්ගේ මාළිගය මහල් සතකින් සමන්විත විය. වාස්තු විද්‍යාත්මකව මෙම ගොඩනැගිලි, පහළ මාල සන ගඩොලින් ආවරණය කෙරුණු දැවයෙන් නිමවුණු ගොඩනැගිලි විය. මෙවන් ගොඩනැගිලි බොහොමයක ඉහළින් වූ දැවමය මතුමහලවල සහ වහලයෙහි බර, බිම්මහල සාදන ලද ගල් කණු විශාල සංඛ්‍යාවක් මතින් දරා සිටිනු ලැබුණි.



සත්මහල් ප්‍රාසාදය

ලංකාතිලකය, තිවංකය සහ ථූපාරාමය වැනි උස් වූ ගඩොලින් තැනූ, පිළිම ගෙවල් ගඩොලින් කළ අර්ධ ගෝලාකාර වහලවලින් සමන්විත වූ අතර උස් වූ අඩු සනකමින් යුත් අභ්‍යන්තර බිත්තිවලට ශක්තිය ලබාදෙමින් සහ වටේ ගමන් කිරීම සඳහා අතර මැද මගක්



ලංකාතිලක පිළිම ගෙය

නිර්මාණය කරමින් වඩා සනකමින් යුත් තවත් පිටත බිත්තියක් පෙර කී මගට ආලෝකය ලබා දුන් එහි සවි කෙරුණු ජනේල සහිතව ඉදිකරන ලදී. ලංකාතිලකයේ ඉදිරිපස වූ වටකුරු කුලුනු ද්විත්වය ඒවායේ උස අතිශෝක්තියෙන් පෙන්වා දෙන දෘෂ්ටි මායාවක් පෙන්නුම් කෙරෙන සේ මධ්‍යය දෙසට ආනත කොට ගොඩනගණු ලැබුණි. මෙම ගොඩනැගිලිවල බාහිර බිත්ති මතුපිට ගඩොල් සහ සියුම් බදාම කැටයම් කලාව භාවිත කොට සතුන් සහ වාමන රූප හෝ නර්තනයේ යෙදෙන කුරුමිට්ටන් නිර්මාණය කොට තිබුණි. ඉහළ ප්‍රදේශ, දෙවියන්ගේ සහ බෝධිසත්ව රිද්මීය රූපවලින් සමන්විත විමාන නමින් හැඳින්වෙන වාස්තු විද්‍යාත්මක ආකෘති මගින් විචිත්‍ර කරන ලදී. මෙම සියලු දෑ සුදු, කහ, රතු වර්ණවලින් අලංකාරවත් ලෙස පින්තාරු කර තිබුණි. මෙම ගොඩනැගිලිවල අභ්‍යන්තර බිත්ති ජාතක කතා සහ බුදුරදුන්ගේ ජීවිත චරිතයෙහි එක් එක් කාලපරිච්ඡේද බිතුසිතුවම්න් පෙන්නුම් කොට තිබුණි. තිවංකයෙහි ඇති එවැනි සිතුවම් මේ වන තෙක් බොහෝ දුරට සංරක්ෂණය වී තිබේ.

පොළොන්නරුවේ දළඳ මාලිගා චතුරස්‍රය ගල් සහ ගඩොල්වලින් තැනූ බොහෝ ගොඩනැගිලිවලින් සමන්විත විය. වටදාගෙය යනු ක්‍රි.පූ. 12වන සියවසෙහි 01වන පරාක්‍රමබාහු රජතුමා විසින් ප්‍රතිසංස්කරණය කරන ලද ස්ථූප ගෘහයකි. එය, ප්‍රධාන දිශා හතරෙහි අලංකාර ලෙස කැටයම් කරන ලද ගල් පඩිපෙළින් සහ ගොඩනැගිල්ල වටා ගලින් තැනූ කොරවක් ගල් මගින් විචිත්‍ර කරන ලද වටකුරු ගොඩනැගිල්ලකි. ප්‍රධාන දිසා හතරට මුහුණලා පිහිටි විශාල ශෛලමය බුදු පිළිම 04 ක් සමඟ කුඩා ස්ථූපයක් වටා වූ ඒක කේන්ද්‍රික වෘත්ත තුළ පිහිටි ශෛලමය කුලුණු කට්ටල 03 ක් තිබේ. මෙම ගොඩනැගිල්ලෙහි කේතු ආකාර වහලය පසුකාලීනව විනාශ වී තිබේ. නිශ්ශංක ලතා මණ්ඩපය නෙළුම් මල් නටුවේ රිද්මීය රටාවකට කැටයම් කරන ලද විචිත්‍රවත් කුලුණු සහිත පිරිත් දේශනා කරනු ලැබූ ශාලාවකි. රජවරුන් දෙදෙනෙකු විසින් බුදුහිමිගේ දන්ත ධාතුව තැන්පත් කිරීම සඳහා තනවන ලද ගොඩනැගිලි දෙකක් වටදාගෙය ඉදිරිපිට තිබේ.

පොළොන්නරුව යුගයෙන් පසු නගර සැලසුම්

ක්‍රි.පූ. 12වන සියවසෙන් පසු ගෘහනිර්මාණ ශිල්පීය රටාව වෙනසකට



තිවංක පිළිම ගෙය

බඳුන් විය. ආරක්ෂක කටයුතු සඳහා වූ ඒක කේන්ද්‍රීය තටාකවලින් සහ දිය අගල්වලින් නගරය ආරක්ෂා වන අතරම බිඳ හෙළිය නොහැකි කඳුකරය මත ගොඩනගන ලද රාජකීය මාලිගා සංකීර්ණය සමඟ විශාල කඳුකර ප්‍රදේශද ඇසුරු කරගෙන සැලසුම් කරන ලද සහ ගොඩනගන ලද රාජකීය නිවෙස්න සහිත ප්‍රධාන නගර තුනක් විය. සම්ප්‍රදායක නගර සැලසුම්වලදී ගිරිදුර්ග ලෙස නම් කෙරෙන ආරක්ෂක සංකල්පය පාදක කොට ගෙන



ගඩලාදෙණිය රජමහා විහාරය

දඹදෙනිය, යාපහුව සහ කුරුණෑගල රාජධානි සැලසුම් කරන ලදි.

ගම්පොල යුගයෙහි ගෘහනිර්මාණ ශිල්පය

ගම්පොල යුගය (ක්‍රි. පූ. 1341- 1391) තුළදී පන්සල හා ගම පදනම් කොටගත් භූ දර්ශන සැලසුම් ක්‍රියාවලියක් දක්නට ලැබුණි. පන්සලට සේවය කළ පවුල් විශාල සංඛ්‍යාවක් පදිංචිව සිටි ප්‍රධාන මාවත ඔස්සේ තනන ලද නිවාසවලින් සමන්විත ග්‍රාම සැලැස්ම සහිතව ප්‍රධාන පන්සල වටා ගම සැලසුම් කිරීම කරන ලදී. ගම්මුන්ගේ සේවය සැලකිල්ලට ගෙන බෞද්ධ සහ හින්දු සිද්ධස්ථාන දෙවගයම සහිතව සැලසුම් කරන ලදී. ලංකාතිලකයෙහි සහ ගඩලාදෙණියෙහි බෞද්ධ පිළිම ගෙය වඩා ප්‍රමුඛ වූ අතර හින්දු පූජස්ථානය කුඩා ප්‍රමාණයේ එකක් විය. ඇම්බැක්කේ, වැගිරියේ, සොරගුණේ, උග්ගල් අලුත් නුවර යනාදී වෙනත් පන්සල්වල හින්දු දේවාලය ප්‍රමුඛ වූ අතර බෞද්ධ පිළිම ගෙය ප්‍රමාණයෙන් කුඩාවට සාදන ලදී.

ගම්පොල, ලංකාතිලක පිළිම ගෙය පොළොන්නරුවේ දක්නට ලැබෙන ආකාරයේ ගඩොල් ගොඩනැගිලි වාස්තු විද්‍යාත්මක ශෛලයටම අර්ධ ගෝලාකාර වහලයක් සහිතව සාදනු ලැබ ඇත. මෙහිදී යොදාගත් ගොඩනැගිලි ද්‍රව්‍ය අධික වර්ෂාව සහිත කාලගුණයකට නොගැලපෙන බව වසර සියයකට පසුව සොයාගැනීමෙන් අනතුරුව උළු සෙවිලි කරන ලද සංකීර්ණ වහලයක් සකස් කරන ලදි. ගඩලාදෙණියේ පිළිම ගෙය ඉන්දියාවේ ගෘහනිර්මාණ ශිල්පියෙකුගේ මග පෙන්වීම යටතේ දකුණු ඉන්දියානු පූජාස්ථාන ගෘහනිර්මාණ ශිල්ප සම්ප්‍රදාය යටතේ ගොඩනගන ලද ශෛලමය ගොඩනැගිල්ලකි. එහි බුදු මැදුරට ඉහළින් අර්ධ ගෝලාකාර වහලයක්ද විෂ්ණු දේවලෙයට ඉහළින් කුඩා වහලයක්ද විය. මෙම ශෛලමය ගොඩනැගිල්ලද පසු අවස්ථාවක උළු වහලයකින් ආවරණය කරන ලදී. බෙරවාදන ශාලාවකට වෙන් කෙරුණු, දැවවලින් සාදන ලද විවෘත මණ්ඩප ගොඩනැගිල්ලක් සහිතව කතරගම දෙවියන්ට කැපකරන ලද දෙමහල් දෙවොලක් ඇම්බැක්ක දේවාලයේ දක්නට ලැබේ. අලංකාර ලෙස කැටයම් කොටන ලද දැව කුලුනු සහ කැපී පෙනෙන විචිත්‍රවත් දැව වහලයකින් සමන්විත වන මෙම දේවාලය දැව ගෘහනිර්මාණ ශිල්පය සඳහා කදිම උදාහරණයක් ලෙස සැලකිය හැකිය.



ඇම්බැක්කේ දේවාලය

වේගිරිය යනු අවලෝකිතේශ්වර, නාථ සහ බිසෝ බණ්ඩාර ලෙස හැඳින්වෙන තාරා දෙවඟන යන දෙවිවරුන්ගේ මැටියෙන් තැනූ පිළිම තැන්පත් කළ පූජාස්ථානයක් ලෙස සැලකෙන ගල් ලෙනකි. මනබඳින අධ්‍යාත්මික පරිසරයකට ඉඩහසර සලසමින් එකිනෙකින් ස්වාධීන වන ලෙස ගුහාවෙහි මධ්‍යයට වන්නට පිළිම තැන්පත් කරන ලද මෙම ලෙනෙහි බිම සහ සීලිම සුදුහුණු පිරියම් කොට තිබේ. මෙම පුදබිමේ වූ දැවමය දොරටුව මල්කම් සහ සත්ව රටා යොදා ගනිමින් විචිත්‍රවත් ලෙස කැටයම් කොට ඇත. ප්‍රබල දකුණු ඉන්දියානු බලපෑම් මගින් වූ ප්‍රතිඵලය වූ මානව - සමාජ - සංස්කෘතික සංකීර්ණතාවයේ නිපැයුමක් ලෙස ගම්පොළ ගෘහනිර්මාණ ශිල්පය හැඳින්විය හැකිය.



මහනුවර යුගය

ශක්තිමත් දේශපාලන ස්ථාවරභාවයක් උදෙසා දිවයිනේ බටහිර වෙරළබඩ තීරයට ආසන්නව පිහිටි කෝට්ටේ වෙත රාජකීය අගනගරය රැගෙන ගියද, පෘතුගීසීන් විසින් විනාශ කරන ලද හෙයින් එහි වාස්තු විද්‍යාත්මක නටඹුන් කිසිවක් ඉතිරි වී නොමැත. ක්‍රි. පූ. 16 වන ශතවර්ෂයේදී මහනුවර රාජධානිය පිහිටුවීමත් සමග ශ්‍රී ලාංකීය ගෘහනිර්මාණ ශිල්පයෙහි නව මාදිලියක් ආරම්භ විය. ගම්පොළ සමයේ රජුට සේවය කළ කැටයම්කාර පවුල් තම ශිල්පයෙහි අඛණ්ඩව යෙදෙමින් මහනුවර යුගය තුළද දිවි

ගෙවූහ. පසුව මොවුන් මහනුවර රජුට ද සේවය කරන්නට ඇත. මහනුවර යුගයෙහි ගෘහනිර්මාණ ශිල්පය ජනතාව මුල්කරගත් ස්වභාවයකින් යුක්ත වූ අතර පරිමාණයෙන් කුඩා වූ නමුදු සිතුවම් සහ කැටයම්වලින් වඩාත් ඔපලන අන්දමින් විචිත්‍රවත් විය. මෙම විචිත්‍රවත් ස්වභාවය ගොඩනැගිලිවල පමණක් නොව ගෘහභාණ්ඩ, ගෘහස්ත අයිතම, සහ මුළුතැන්ගෙයි උපකරණවලද දක්නට ලැබුණි.

මහනුවර නගරයෙහි සහ මහනුවර රාජධානිය තුළ වූ ගම්මානවල තිබුණු ආගමික ගොඩනැගිලි අතර පිළිම ගෙවල් ගොඩනැගිලි අතර වැදගත්ම ස්ථානය රඳවා ගනිමින් අඛණ්ඩවම පැවතුණි. ප්‍රධාන වාස්තු විද්‍යාත්මක ආකාර තුනක් මෙහිලා හඳුනා ගත හැකිය.

1. ලෙන් ගුහා පන්සල් - පිවිසුමෙහි ඉහළ දොරයෙහි දිය ඇතුලට කාන්දුවීම වළකාලීම සඳහා කටාරම් කොට ඇති, ආලින්දයක් එක් කිරීමෙන් ඉඩකඩ වැඩි කර සකසන ලද සහ හිඳි පිළිම, හිටි පිළිම, හා සැතපෙන බුදු පිළිම සහිත ස්වභාවික ලෙන් හමුවී තිබේ. මේවායින් සමහරක් අනුරාධපුර සහ පොළොන්නරු යුගවල වූ පුදබිම් නැවත පිළිසකර කිරීමක් විය. පිවිසුම් ද්වාර මාර්ගයට ඉහළින් මකර තොරණක් හමුවීම මෙකල දැකිය හැකි විය. මෙම පූජාස්ථානවල ඇතුලත බිත්ති මත සහ සීලිමෙහි බුදුරදුන්ගේ පෙර භවයන් පෙන්නුම් කෙරෙන ජාතක කතා සහ බුදුහිමියන්ගේ ජීවිත චරිතයේ විවිධ කාලපරිච්ඡේද පෙන්නුම් කෙරෙන බිතුසිතුවම්වලින් අලංකාර කොට ඇත. මේවා අතරින්, දඹුල්ලේ ලෝක උරුම බිමෙහි වූ විශාල සංඛ්‍යාවක් බුදු පිළිම සහ සිතුවම් සහිත තුන්වන ලෙන විශේෂිත වූවක්වේ. මෙකී ලෙන මුල් යුගයේ තනන ලද ලෙන් ගුහාවලට සමාන්තරව 18 වන සියවසේ මැද භාගයේ දී තනා තිබේ.

2. පිළිම ගෙවල් - මේවා මැටියෙන් හෝ මැටි ගඩොල්වලින් හෝ තැනූ බිත්ති සහිත පාදක තලයක් මත නංවා සාදන ලද ස්ථාවර ගොඩනැගිලිවේ. මෙම ගොඩනැගිලි දැවයෙන් කරන ලද රාමුව සහිත දිග අගුවක් ඇති, පැතිලි මැටි උළු වහලවලින් ආවරණය කොට තිබුණි. මේ ගොඩනැගිලි අතරින් ලේවැල්ලේ පිහිටි ගංගාරාම පිළිමගෙය සුවිශේෂීවේ. උස්වූ ඝන මැටි ගඩොල් බිත්තිවලින් වටවූ, මීටර් හත හමාරක් උසට සිටින ලෙස පාෂාණයක් මත නෙලන ලද හිටි බුදුපිළිමයක් මෙහි ඇත. ශෛලමය කුලුනු සහිත පහළ මට්ටමේ ආලින්දයක් සහිත මෙම පූජාස්ථානයේ තුන්පැත්තක් මිටි බිත්තියකින් වට වී ඇති අතර ඉතිරි කොටස පර්වත බිත්තියෙන් සීමාවිය. ඇතුලත බිත්තිවල ඇස්මට්ටමට එනතෙක් වූ පහළ කොටස් බුද්ධ චරිතයෙහි විවිධ අවස්ථාවලින් සහ ජාතක කතා නිරූපණය කරමින්



සිත්තම් කර තිබේ. මෙම බිත්තිවල ඉහළ කොටස් සිය ගණනක් වූ චතුෂ්කෝණ තුළ අඳින ලද හිඳි බුදුපිළිමවල සිතුවම්වලින් පිරී ඇති අතර සීලිම සිතුවම්වලින් අලංකාර කොට තිබේ.

ගම්මානවල පිහිටි පන්සල්වල වූ කුඩා පිළිම ගෙවල් ගම් ප්‍රධානියාගේ අනුග්‍රහය යටතේ බෙහෝ විට ගම්මුන් විසින් සාදනු ලැබීය. මෙකී කුඩා බුදුගෙවල්වල වූ මැටි බිත්ති පාදමක් මත ගොඩනගනු ලද අතර පුද පූජා සහ උත්සව අවස්ථාවලදී බෙර නාද කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩ සපුරාලීමට ඉදිරි ආලින්දයක් එහිම තනන ලදී. ප්‍රධාන හිඳි පිළිමයට පසුතලය සපයමින් ඉදිරි බිත්තිය පිවිසුම් දොරටුවට මුහුණලා තිබුණි. දෙපස තිබූ පැති බිත්ති ඔස්සේ හිටි බුදුපිළිම දෙකක් සහ සමන් හා උපුල්වන් හෝ විෂ්ණු හා කතරගම දෙවිවරුන්ගේ හෝ පිළිම දෙකක් මෙහි තිබේ. වෙස්සන්තර ජාතකයේ බිතු සිතුවමින් සහ බුද්ධ චරිතයේ විවිධ අවස්ථා නිරූපණය කරමින් බිත්ති අලංකාර කොට තිබේ. සීලීම, නෙළුම් විල් සහ ජ්‍යාමිතික මෝස්තරවලින් විචිත්‍ර කොට තිබේ. විශාල යතුරක් සහිත ඝන දැව දොරටුව ඇණ යොදා සවි කොට තිබේ.

3. මහනුවර රාජධානියේ ගම්බදට වන්නට සාදන ලද තෙවැනි වර්ගයට අයත් පිළිම ගෙවල්, මිටි හෝ උස ගල් කුලුනු, දැව කුලුනු හෝ ගල් කුළු වැනි ආධාරක මගින් දරා සිටින දැව වේදිකා මත ගොඩනැගුණු ටැම්පිට විහාර හෝ "කුලුනු මත පන්සල්" ලෙස හඳුන්වනු ලැබුණි. මේවායේ සැලසුම් චතුරස්‍රාකාර හෝ සෘජුකෝණාස්‍රාකාර හැඩයක් ගනී. චතුරස්‍රාකාර සැලැස්මක් සහිත ගොඩනැගිලිවල ඉදිරි ආලින්දයක් තිබුණු අතර සමහර විට ඒවා බුදුගෙය වටා දිවෙන පටු ආලින්දයකින් ද සමන්විත විය. චතුරස්‍රාකාර බුදු ගෙවල් මීටර් දෙකක් උස කුලුනු මත ඉදි කෙරුණි. රේඛීය ගොඩනැගිලිවල ඉදිරිපස ආලින්දය වඩා දිගු වූ අතර බෙර වාදනය කරන ශාලාවක් ලෙස භාවිතයට ගන්නා ලදී. සමහර ගොඩනැගිලිවල වෙනම මණ්ඩපයක් හෝ කුලුනු සහිත ශාලාවක් පසුකාලීනව ගොඩනගන ලදී. මෙම ටැම්පිට විහාර ගොඩනැගිලි තුළ බුදුරදුන්ගේ ප්‍රධාන හිඳි පිළිමයක් සමග හිටි පිළිම ද්විත්වයක් සහ ආරක්ෂක දේවතාවුන් දෙදෙනෙකු දක්නට ලැබේ.

ඇතුළත වූ සියල්ල සිතුවම්වලින් විචිත්‍ර කර ඇත. මෙවැනි සමහර දෙමහල් ගොඩනැගිලිවල තියුණු ආනතියකින් යුත් පියගැට පෙළක් දක්නට ලැබේ.

මහනුවර මාලිගා සංකීර්ණයෙහි හමුවන දළඳා මාලිගාව දෙමහල් ටැම්පිට විහාරයක මූලාකෘතියක් මත ඉදි කෙරුණු සුවිශේෂී ගොඩනැගිල්ලක් විය. මෙම විශේෂ පූජාස්ථානය පන්සල් සංකීර්ණයෙහි වූ වෙනස් දෙමහල් ගොඩනැගිලි සමුහයක අංගනයක් මත ස්ථානගත කොට තිබේ. එය, ඉදිරිපස සහ දෙපස ගල් පඩි ඔස්සේ සකසන ලද ගලින් තැනූ කුලුනු සහිත ආලින්දයක් ඇති උස්කරන ලද විචිත්‍රවත් පාදමක් සහිත සෘජුකෝණාස්‍රාකාර ගොඩනැගිල්ලකි. විශාල දොර උළුවහු තුනම ගලින් කරන ලද සහ මල්කම් හා ජ්‍යාමිතික රටා කැටයම් කර සියුම්ව අලංකරණය කර ඇත. නුවර යුගයේ සඳකඩ පහණ, පියගැට පෙළ තුනෙහිම පිවිසුම් ලක්ෂ්‍යයෙහි පිහිටුවා තිබෙණු දක්නට ලැබේ. ඉහළ දැව මහල "අරමුදල" නම් වූ ගබඩා කුටීරය ඉදිරිපස වූ ඉදිරි ශාලාව ඔස්සේ ඉහළ නගී. දත්ත ධාතුව තැන්පත් කර ඇති අභ්‍යන්තර බුදු මැදුර ඉදිරියෙන් වූ ඉදිරි විවෘත ශාලාවකින් මෙම මහල සමන්විතය. මෙම ගොඩනැගිල්ල වටා යන, වහලයෙහි දික්වූ අගුවලට ආධාරය ලබා දෙන විසිතුරු කරන ලද දැව කුලුනු සහිත ආලින්දයක් තිබේ. සිංහල ගෘහනිර්මාණ ශිල්පයෙහි යොදාගත් ඉදිකිරීම් ද්‍රව්‍ය සියල්ල ව්‍යුහමය සහ විචිත්‍රකරණ ආකාරවල යොදාගනු ලැබ තිබීම මෙකී ගොඩනැගිල්ල වාස්තු විද්‍යාත්මක සුවිශේෂී නිර්මණයක් බවට පත් කරනු ලැබ තිබේ.

වාත්තු කරන ලද පාදමක් සහිත කැටයම් කළ කුලුනු, විචිත්‍රවත් ලෙස කැටයම් කරන ලද දැවයෙන් තැනූ දොර උළුවහු, කැටයම් කොට තැනූ කණු, කැටයම් කරන ලද බාල්ක, කුරුපා, පරාල මෙම ගොඩනැගිල්ල තුළ දක්නට ලැබේ. යකඩ, පිත්තල, රිදී සහ රත්රන් වැනි සියලුම ඉදිකිරීම් ලෝහ වර්ග මෙහි ගෘහනිර්මාණ ශිල්පය තුළ අන්තර්ගත කොට ඇත. නිමවන ලද ගරාදි වැටෙහි කණු, කහ, කළු, රතු සහ කොළ පැහැති ලාක්ෂවලින් විචිත්‍රවත් කර තිබුණි. දොර උළුවහු සහ ඉහළ මාලයේ රාමු කැටයම් කළ ඇත් දළ සහ අලින්ගේ අස්ථිවලින් තැනූ පැනල මගින් අලංකාරකොට තිබුණි. මෝස්තරවලට යොදා ගන්නා අංගවලින් මැටි උළු වාත්තු කොට තිබුණි. කුලුනු, බාල්ක, කුරුපා, සීලින්, පැනල, දොර රාමු සහ බිත්ති යන සියල්ල සිංහල චිත්‍ර කලාවේ සියලුම අංග නිරූපණය වනසේ සිතුවම් කොට තිබුණි. මධ්‍යයේ වූ බුදුගෙය; වැඩසිටින මාලිගය සිංහල ගෘහනිර්මාණ ශිල්පයට ආවේණික වූ අද්විතීය නිර්මාණයකි. මාලිගා ගොඩනැගිලි අතරින් මන්ත්‍රණ ශාලාව ඉතා සුවිශේෂී දැව ගොඩනැගිල්ලක් ලෙස හැඳින්විය හැකිය. මෙය පොළොන්නරු යුගයේ සිට අවිච්ඡින්නව පැවත ආ මන්ත්‍රණ සභාවේ සැලසුම අනුගමනය කිරීමක් විය. මෙම ගොඩනැගිල්ල වාස්තු කරන ලද පේකඩක් සහිත දිගටි ගොඩනැගිල්ලක් වන අතර කැටයම් කරන ලද උස දැව කුලුනු 68ක් ද්විත්ව පේළි දෙකක් වනසේ පුළුල් මධ්‍ය අවකාශයක් සහිත වන ආකාරයට සකස් කොට ඇත. සියලුම කුලුනු මත තබන ලද කැටයම් කරන ලද කුරුපා මත ද්විත්ව වහලයේ බරැති දැව සැකිල්ල තබා තිබේ. දික්වූ අගු සහිත බරැති විශාල වහලය පැතලි මැටි උළු මගින් ආවරණය කර තිබෙන අතර එහි මුදුනත පිත්තලින් තැනූ කොන් දෙකක් සවි කොට ඇත.



ටැම්පිට විහාරය

මහනුවර යුගයේ ගෘහනිර්මාණ ශිල්පය හා බැඳුණු වැදගත් කරුණක් වන්නේ බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් 1815 දී අප රට යටතේ කර ගැනීමට පෙර මෙහි තිබූ ශිෂ්ටාචාරයෙහි අවසාන පුරුක මෙය වීමයි. සම්ප්‍රදායික ආගමික ගෘහනිර්මාණ ශිල්පයෙහි කැපී පෙනෙන ලක්ෂණය වූයේ සොබාදහම, දේශගුණය, සහ පරිසරය සමග ජීවත්වීමේ දර්ශනය පිළිබඳ දක්වන සැලකිල්ල එමගින් වටහා ගැනීමයි. ඔවුන්ගේ සැලසුම්වල සරල බව, සහ සුලබ ඉදිකිරීම් ද්‍රව්‍ය භාවිතය හැරුණු විට පුනරාවර්තනය මගින් වාස්තු විද්‍යාත්මක රටා පවත්වාගෙන යෑම සහ සංරක්ෂණය කිරීමේ සංස්කෘතියකට ඔවුන් අනුගත වූ බව මෙහිලා අවධාරණයෙන් සඳහන් කළ යුතුය. සංස්කෘතිකමය වටිනාකම් සහ සම්ප්‍රදාය නොසලකා හැරීම සහ බටහිර ආකෘතියට අනුව සැකසුණු අධ්‍යාපන පද්ධතියක බලපෑම කරණ කොට ගෙන යුරෝපීය සිරිත් පිළිගනු ලැබීම මගින් සමාජයේ ඉහළ ස්තරවල වටිනාකම් හීනවීම ශ්‍රී ලංකාවේ අද්විතීය වූ ගෘහනිර්මාණ ශිල්පය වෙනසකට බඳුන් කළා පමණක් නොව අප රටේ මිනිසුන්ගේ ජීවන රටාව වෙනසකට බඳුන් කිරීම ද සිදු කෙරුණි.

මහාචාර්ය නිමල් ද සිල්වා
0714210389


දේශීය වෛද්‍යකමේ විකාශනය හා උපයෝගීතාවය

ආචාර්ය නිමල් කරුණාසිරි



ආයුර්වේදය හෙවත් ආයුෂ පිළිබඳ විද්‍යාව උත්තර භාරතයේදී මීට වසර තුන් දහසකට පෙරදී ආරම්භ වූ බව පැවසේ. ආසියාව තුළ බිහිවූ වෛද්‍ය ක්‍රම අතරින් ආයුර්වේදය අනෙකුත් වෛද්‍ය ක්‍රමයන්ට වඩා සංවිධිත වූත්, දාර්ශනික වශයෙන් මෙන්ම න්‍යායික වශයෙන්ද ප්‍රායෝගික වශයෙන්ද පෝෂණය වූවකි. එම වෛද්‍ය ක්‍රමය ප්‍රධාන ගුරුකුල දෙකක් පැවති බව විග්‍රහ කෙරේ. එනම් ධන්වන්තරී සම්ප්‍රදාය හා ආත්‍රෙය සම්ප්‍රදාය වශයෙන් ආත්‍රෙය මුනිවරයා සතු අධිභෞතික විඥාණය එසේ නැත්නම් ඍෂි දෑනුම පදනම්ව ආයුර්වේදයේ කාය චිකිත්සාව බිහිවූ බවද ධන්වන්තරී මහා ඍෂි ගේ දෑනුම පදනම්ව ශල්‍ය චිකිත්සාව බිහිවූ බවද විශ්වාස කෙරේ.

කාය චිකිත්සාවේ ප්‍රායෝගික වෛද්‍යවරයා වූ චරක මුනිවරයාගේ ඉගැන්වීම් මත සෑම රෝගයක්ම හා ඊට ප්‍රතිකාර හා නිවාරණ ක්‍රම පැහැදිලි කර ඇති අතර රෝග නිර්ණය කිරීම සඳහා ආයුර්වේද මූලධර්ම පදනම් වූ පංචභූතවාදය, ත්‍රිදෝෂ වාදය, සප්තධාතු වාදය ආදී වූ වාදයන් ආශ්‍රයෙන් රෝගියා හා රෝගය ද ඒ අනුව යෙදිය යුතු ප්‍රතිකාර ගැනද තාර්කික විග්‍රහයන් හා විශ්ලේෂණයන්ගෙන් ද මෙය සමන්විත වේ. මේ අයගේ කාය චිකිත්සාව, කෞමාරභෘතප්‍ර අගද තන්ත්‍රය භූත විද්‍යාව හා රසායන, වාජීකරණ යන අංග ගැන සාකච්ඡා කරයි.



චරක මුනිවරයා

ශල්‍ය චිකිත්සාවේ පියා ලෙස සැලකෙන සුශ්‍රුත ආචාර්ය වරයා විසින් ඖෂධීය ප්‍රතිකාර මඟින් සුවකළ නොහැකි රෝග සුවපත් කිරීමේ ක්‍රමවේදයක් ලෙස ශල්‍ය (තියුණු) හා ශලාකා (මොට) ආයුධ භාවිත කරමින් කායච්ඡේදනය හා අංගයන් කැපීම, ඉවත් කිරීම හා බද්ධ කිරීමේ ක්‍රම පිළිබඳ උගන්වනු ලැබේ.

ඒ අනුව ස්වයං ආයුර්වේදය අංග අටකින් යුත් අෂ්ඨාංග ආයුර්වේදයකින් යුක්ත වන අතර ඒ අනුව රෝග රෝගී විභාගය සිදු කරයි. එපමණක් නොව එම ආයුර්වේදය විද්‍යාව තුළ මිනිසාට සෞඛ්‍ය ගැන පමණක් නොව සතුන් හා ශාකවලට වැළඳෙන ලෙඩ රෝග හා ඒවා පාලනය කිරීම පිළිබඳවද ඉගැන්වේ. එනම් සත්ව ආයුර්වේදය (ගජ ආයුර්වේදය, අශ්ව ආයුර්වේදය.....) හා ශාක ආයුර්වේද වශයෙන් හඳුන්වන අංගවලින් සමන්විත වේ. තවද ඓතිහාසික තොරතුරු විමර්ශනය කිරීමේදී මෙම ආයුර්වේද වෛද්‍ය ක්‍රමය න්‍යායාත්මක පදනම් කොට නැඟීමේදී න්‍යාය, වෛශේෂික, දර්ශනයන් මෙන්ම, ඍග්වේදය, යජුර්වේදය, අතර්වන්වේදය වැනි වේද ශාස්ත්‍රවල ආභාෂයද ලබාගෙන ඇති බව පෙන්වයි. එපමණක් නොව, අතීත භාරතය තුළ විවිධ වූ දාර්ශනික ඉගැන්වීම් ඔස්සේ ලබාගත් භෞතික විද්‍යා දෑනුම මෙන්ම රසායන විද්‍යා දෑනුමක්ද ඔවුන් සතුවූ බව පෙනේ. බටහිර වෛද්‍ය පදනමේ

හිපොක්‍රටීස්ගේ මූලික ඉගැන්වීම් හා විශ්වාස හා සැසඳීමේදී ආයුර්වේදීය ඉගැන්වීම් හා සංකල්ප හිපොක්‍රටීස්ගේ ඉගැන්වීම් හා සංකල්පවලට වඩා ඉදිරියෙන් වූ බව පෙනේ.

ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය, එනම්, ශ්‍රී ලංකාවට ආවේනිකව පැවැති දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමය ආයුර්වේදීය වෛද්‍ය ක්‍රමය හා ස්වීකරණය වී ඇති බව පෙනේ. දේශීය පාරම්පරික වෛද්‍යවරුන්ගේ රෝග විනිර්ණය සඳහා වූ පදනම ලෙස, වාත, පිත, කං යන ත්‍රිදෝෂ වාද මෙන්ම පංචභූතවාදය හා සප්තධාතු වාදය ද යොදා ගනී. එහෙත් දේශීය පාරම්පරික වෙදකමේදී, ඌෂ්ණ, ශීත සංකල්ප ද ත්‍රිදෝෂ සංකල්පයට වඩා වැඩි සැලකිල්ලක් දක්වන බව පෙනෙන අතර මෙම ඌෂ්ණ, ශීත සංකල්පය දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමයේ පදනම ලෙස සැලකිය හැකිය. ඌෂ්ණ - ශීත සංකල්පවලට සමාන ලෙස චීනයේ පාරම්පරික වෙදකමේ භාවිත වන යීං යෑං සංකල්පය කොරිස් පාරම්පරික වෙදකමේද මේ හා සමඟ දවාකාර ප්‍රතිබද්ධිත රෝග ඇති කිරීමේ සංකල්ප විග්‍රහ කෙරේ. මෙම සංකල්ප බොහොමයක් පරිසරය තුළ සිදුවූ වෙනස්වීම් මත විග්‍රහ කෙරෙන බව පෙනේ. විශේෂයෙන්ම පැහැදිලි ඍතු වෙනස්කමක් දැකිය නොහැකි ශ්‍රී ලංකාව වැනි රටක ඉතාම උණුසුම් සහිත පරිසරයක් මෙන්ම අනෙකුත් මාස හය අඩු වර්ෂාපතනයක් සහිත සිසිල් පරිසරයකි. ඒ අනුව ඇතිවන රෝග තත්වද අතීත ජනතාව හඳුනාගෙන තිබෙන්නට ඇති අතර ඊට ප්‍රතිකාර යෙදීමේදී ද එම තත්වවලට අනුකූලවූද ප්‍රතිවිරුද්ධ වූද චිකිත්සා යෙදීමට උත්සුක වී ඇති බව පෙනී යයි.

දේශීය පාරම්පරික චිකිත්සීය පොත් පත් පරිශීලනය කිරීමේදී පෙනී යන්නේ එකී රෝග විනිර්ණය කරවූ ආකාරය හා පිළිපැදිය යුතු වත් පිළිවෙත් මෙන්ම ඖෂධීය ප්‍රතිකාර බොහොමයක්ම මතක තබා ගැනීමේ පහසුව සඳහා හෝ පරම්පරාවෙන් පරම්පරාවට සුරක්ෂිතව තැබීම සඳහා ඒවා ගද්‍යයට වඩා පද්‍යයෙන් රචනා කර තිබීමයි.

ඉන්දියානු ආයුර්වේදයේ ප්‍රචලිත නොවූ ඖෂධ වට්ටෝරු බොහොමයක් ශ්‍රී ලාංකීය පාරම්පරික වෛද්‍ය ක්‍රමය තුළ භාවිත වන බව දැකිය හැකිය. ඉන්දීය ආයුර්වේදයේ බොහොමයක් ඖෂධ ඉන්දියාවේ වැවෙන කුළු බඩු හා විශේෂ ඖෂධ වර්ග කේන්ද්‍රකරගත් චිකිත්සා පද්ධතියකින් සමන්විත වන අතර ශ්‍රී ලාංකාවේ පාරම්පරික දේශීය චිකිත්සාවේ ප්‍රධාන ඖෂධ ලෙස අරළු, බුළු, නෙල්ලි ප්‍රමුඛ ඖෂධ භාවිත කරන අතර ඒ හා සමඟ මිශ්‍රව



පැරණි බෙහෙත් ඔරුවක්

ඉන්දියානු ආයුර්වේද චිකිත්සාවෙහි සඳහන් නොවූ ශ්‍රී ලංකාවට ආවේනික වූ පැළෑටිමය ඖෂධ රාශියක් භාවිත කෙරේ.

ඉන්දියානු ආයුර්වේදය තුළ කැඩුම් බිඳුම් චිකිත්සාව, සර්ප විෂ චිකිත්සාව



හා පිස්සු බලු රෝග චිකිත්සාව (ජල භීතිකාව), අපස්මාර චිකිත්සාව, මාන්දම් චිකිත්සාව එතරම් ප්‍රමුඛ චිකිත්සාව ලෙස සඳහන්ව නැතත්, ශ්‍රී ලාංකීය, දේශීය චිකිත්සාවේ ඉහත සඳහන් රෝග අවස්ථා සඳහා වැඩි ඉඩ කඩක් හා ඖෂධීය ප්‍රතිකාර පද්ධති රාශියක් ඇති බව පෙනේ.


කැඩුම් බිඳුම් හා සර්ප විෂ චිකිත්සා ගැන සැලකීමේදී ඒ ඒ භූගෝලීය ප්‍රදේශ අනුව කැඩුම් බිඳුම් හා සර්ප විෂ ප්‍රතිකාර සඳහා භාවිත කරන ඖෂධ පන්තීන් හා උපචාර විධි වලද වෙනස්කම් පවතින බව පෙනේ. උදාහරණ වශයෙන්, නුවර කලාවිය (අනුරාධපුරය) ප්‍රදේශයේ කැඩුම් බිඳුම් ප්‍රතිකාර සඳහා භාවිත කරන ඖෂධ හා වෙලුම් ක්‍රම සබරගමුව හා රුහුණු පළාතේ භාවිතයට ගැනෙන ඖෂධ හා වෙලුම් ක්‍රමවලට වඩා වෙනස්කම් පවතින බව පෙනේ. මෙමඟින් පැහැදිලි වන කරුණ නම් මෙම වෛද්‍ය ක්‍රම පාරම්පරිකව ඒ ඒ ප්‍රදේශ වල සිටි දැනුම් සහිත උගතුන් විසින් සිය පළපුරුද්ද අනුව ඉදිරියටත්

අඩු වැඩි වශයෙන් වැරදි නිවැරදි කරගැනීමෙන්ම ප්‍රායෝගිකව ලබාගත් දැනුම් පද්ධතියක් බවයි.



මෙයට අමතරව ඉන්දියානු කලාපය තුළ ද්‍රවිඩ සංස්කෘතිය හා බැඳුණු අත්දැකීම් හා පළපුරුද්ද ආශ්‍රයෙන් නිර්මාණය වූ සිද්ධ වෛද්‍ය ක්‍රමවල ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමයක් ලෙස භාවිත කෙරෙන අතර, මෙම වෛද්‍ය ක්‍රමය තුළද උතුරු ඉන්දියානු ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ආභාෂයන් හා මූලධර්ම අන්තර්ගතව ඇත. එසේ වුවද, ඖෂධ භාවිතයේදී හා ශාකමය ඖෂධ භාවිතයේදී යම් යම් ප්‍රාදේශිය වෙනස්කම් දැකිය හැකි අතර, ගෙන්දගම් හා විවිධ පාෂාණ වර්ගද චිකිත්සීය කටයුතු සඳහා යොදා ගැනේ.

එසේම අතීත පර්සියානු ශිෂ්ඨාචාරය තුළ ආරම්භ වී විකාශනය වූ යුනානි වෛද්‍ය ක්‍රමයද ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය ආගම අදහන අය අතර ප්‍රචලිත වෛද්‍ය ක්‍රමයකි. ඉන්දියානු කලාපය තුළ හටගත් වෛද්‍ය සම්ප්‍රදායට වඩා මෙම වෛද්‍ය ක්‍රමයේ බොහෝ වෙනස්කම් දැකිය හැකිය. විශේෂයෙන්ම ආයුර්වේද සිද්ධ හා දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමයක් තුළ රෝග, රෝගී විනිර්ණයේදී භාවිත කරනු ලැබූ ත්‍රිදෝෂවාදය, සප්තධාතු වාදය, පංච භූත වාදය ආදී වූ දාර්ශනික විග්‍රහයන්ට තරමක් වෙනස් විග්‍රහයක් යුනානි වෛද්‍ය ක්‍රමය සතුව පවතින බව පෙනේ. එහිදී රෝගී වීමට හා ඒවා විග්‍රහ කිරීමේදී ත්‍රිදෝෂවාදය වෙනුවෙන් චතුෂ්වාදී සංකල්පයක් යුනානි වෛද්‍ය ක්‍රමය සතුව පවතින බව පෙනේ. එනම්, ඕසුපා, සවුඩා, බල්බා, කුගී, වශයෙන් සතර ආකාරයක ශාරීරික ක්‍රියාකාරිත්වය විග්‍රහ කෙරේ. ඒ මත පදනම්ව සිදුකරන විග්‍රහය මත රෝග හා රෝගී අවස්ථා විශ්ලේෂණය කරන අතර ඒ අනුව චිකිත්සාවද හැඩ ගැසී ඇත. විශේෂයෙන්ම මෙම යුනානි චිකිත්සාවේදී ඖෂධ ලෙස ශාකමය ඖෂධ භාවිතය අඩු මට්ටමක පවතින අතර වැඩි වශයෙන් පාංශුමය ද්‍රව්‍ය සහිත ඖෂධ භාවිතයට වැඩි අවධානයක් යොමු කර ඇත. එවැනි වෙනසක් ඇති වීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ මෙම වෛද්‍ය ක්‍රමය බිහිවන්නේ අරාබිකරය තුළ පවතින ශාක වලින් තොර පරිසරයක් තුළ වීමයි. මේනිසා තම පරිසර පද්ධතියට අනුව චිකිත්සීය ක්‍රියාවලියද හැඩ ගැසී ඇති බව පෙනී යයි. මෙම වෛද්‍ය ක්‍රමයේදී භාවිත කරනු ලබන පාංශුමය ද්‍රව්‍ය පසු කාලයකදී රසායන විද්‍යාවේ දියුණුවත් සමඟ බටහිර ඖෂධීය ද්‍රව්‍ය සකස් කිරීම ද එම මූලද්‍රව්‍යයන්ගේ ගුණ ඒ අනුව විග්‍රහ කිරීමද සිදු කර ඇති අතර මේ සඳහා යුනානි වෛද්‍ය ක්‍රමය පදනම්ව ඇලපති (බටහිර) වෛද්‍ය ක්‍රමය බලගැන්වීම සඳහා මොහොමඩ් අවිපෙරයා වැනි උගත් වෛද්‍යවරුන් ක්‍රියා කළ බව ඉතිහාසයේ සඳහන් වේ.



මේ අනුව වෛද්‍ය ක්‍රම ද ඒ ඒ රටවල සංස්කෘතික හා පාරිසරික වටා පිටාව අනුව සකස් වී ඇති බව පැහැදිලි වන අතර ශ්‍රී ලංකාවේ දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමය ඇතුළු දැනට භාවිත වන දේශීය වෛද්‍ය ක්‍රම සියල්ලම භාවිතය, සංවර්ධනය



හා පැතිරීම ඒ ඒ ජනවර්ග හා සංස්කෘතීන් හරහා ගොඩ නැගුණක් බව තේරුම්ගත හැකිය. ඕනෑම දැනුම් පද්ධතියක් සංස්කෘතිමය, වන්නේය යන්න අසත්‍යයක් නොවේ.

ආචාර්ය නිමල් කරුණාසිරි
0777675679

සිංහල ගොවිතැනේ විදුහුරු සිරිත

මතුගම සෙනෙවිරුවන්



ලංකාවේ මහ පොළව ආශ්‍රිතව ගොඩනැගුණු එහි දේශගුණික හා භූගෝලීය විවිධත්වය අනුව වර්ධනය වූ ගොවිතැන් ක්‍රමවේදය සිංහල ගොවිතැන නමින් ප්‍රකටය. ආහාර නිෂ්පාදනය හා ආහාර සුරක්ෂිතතාවය මුල් කොට කෙරුණක් බැවින් මනුෂ්‍යයාගේ සෞඛ්‍ය පැවැත්ම පිළිබඳව එහිදී දැඩි අවධානයක් යොමු වී තිබූ ආකාරය අධ්‍යනය කළ හැකිය. නමුත් පසු කාලයකදී අනුරාධපුර යුගය අවසාන කාලයේදී ආහාර නිෂ්පාදනයේ අතිරික්තය බදු ගෙවීම සඳහාද අපනයනය සඳහාද යොමුවූ ආර්ථික ක්‍රමයක සංවර්ධනයත් සමග මූලික අරමුණින් බැහැර වාණිජ ආකල්ප වර්ධනය වූ බවද දැකගන්නට හැකිය. එහෙත් ගොවිතැනේ ශිල්පක්‍රමයන්හි වැඩි වෙනසක් සිදුවූයේ නැත. යම් කිසි පරිවර්තනයක් සිදු වූයේ නම් ඒ වාරිමාර්ග අංශයන්හි පමණකි. මෙකී සිංහල ගොවිතැනත් වත්මන්හි අප භාවිතයට ගන්නා රසායනික ගොවිතැනත් අතර පැහැදිලි වෙනස් කමක් පවතී. මෙම ලිපියේ අරමුණ මෙම වෙනස්කම් සහ සිංහල ගොවිතැනේ පරිසර හිතකාමී බව පැහැදිලි කිරීමයි.

වල් මර්දන හා පොහොර කිරීම -

ලංකාවේ ප්‍රධාන ආර්ථික භෝගය වන වී ගොවිතැනේ පාරම්පරික දැනුම පිළිබඳ සලකා බැලීමේදී එහි තිබූ විදුහුරු සිද්ධාන්ත රාශියක් ගැන වටහා ගත හැකිය. එයින් එකක් නම් ආයාසයකින් තොරව සිදු කළ වල් මර්දනය සහ පොහොර කිරීමයි. ප්‍රධාන වශයෙන් බිම් සකස් කිරීම මත වල් පැළෑටි පාලනය සිදු වේ. ලියැදි මට්ටමට පවත්වාගෙන යෑම. එය පදනම්ව අඟලක් පමණ වතුර මට්ටම ඇති වන පරිදි ඉස්නන් බැඳීම. (හිස් නාන් කිරීම නොහොත් ජලය මට්ටම ගොයම් ගහේ ඉහළ දක්වා පවත්වා ගෙන යෑම) සහ වරින් වර ජලය කඩා හැරීම මූලිකව වල් පාලනයේ දී අනුගමනය කරයි.

බිම් සකස් කිරීමේ දී පැරණි ගොවියා උදැල්ලෙන් කෙටීම සී සෑම සහ මැඩවීම යන ක්‍රම අනුගමනය කළේය. කෙටීමේ දී පලුමන් නොහොත් පේලි මතුවෙයි. සී සෑමේදී ද එසේය. මැඩවීමේදී හරක් කුරය එරා බහින බැවින් එහිදීද යම් තරමකින් ජලය රඳා සිටීමට හැකි ඉඩක් ඇති වේ. සම්පූර්ණ ලියැද්ද ජලයෙන් පුරවා පලුමන් වසා තැබීම ගොවියාගේ සිරිත නොවේ. පලුමන් අඩක් පමණ වැසෙන්නට ප්‍රමාණවත් ජලය එහි පවතින අතර කෙටීමෙන් දින කීපයකට පමණ පසු ලියැද්දේ නිර්වායු ශ්වසන තත්ව යටතේ ක්ෂුද්‍රජීවීන් වර්ධනය වේ. නිර්වායු තත්වය යටතේ පසේ ව්‍යුහය භාෂ්මික තත්වයට පත් වේ. මෙය ගොවියා දැන ගන්නේ තමන්ගේ මුව පුරවාගෙන සිටි බුලත් කෙළ පහරක් ලියැද්ද විසිරුවා ගැසීමෙනි. එහිදී හුණු සහ පුවක් නිසා බුලත් විටේ ඇතිවූ භාෂ්මිකතාවය නොහොත් රතු පැහැය වෙනස් වන ආකාරය මත මඩපදම් වීම ගොවියා නිරීක්ෂණය කරයි. භාෂ්මික පරිසරය වල් පැළෑටි වර්ධනය



වළකාලන්නකි. එසේම අහිතකර ක්ෂුද්‍රජීවීන් යටපත් කරවන තත්ත්වයකි. දෙවීයෙන් හෝ දෙමේ කෙටීමෙන් පසු ලියැද්දේ ජලය පුරවා තබා ඉතා ඉක්මනින් වැපිරීම සිරිතයි. වැපිරීමෙන් පසු පස නැවතත් භාෂ්මික තත්වයෙන් මිදී පස උදාසීන තත්වයට පත් වේ.



වැපිරීමෙන් පුරා දින දෙකකට පමණ පසු පැය දොළහක් පමණ ජලය බැඳ තැබීම, අනතුරුව නැවත දින හතරකින් පැය විසි හතරක් ජලය බැඳතැබීම, ඉන් පසු දින හතකින් ජලය බැඳ දින තුනකින් ඉවත් කිරීම, නැවත දින දාහතරකින් ජලය බැඳ දින හතක් තැබීම. මේ කාලය තුළදී මතු විය හැකි කුඩ මැට්ට වැනි වල් පැළැටි මර්දනයට උපකාරී වේ. ඒ වන විට ගොයම් පැළපත උස්ව ඒම නිසා සූර්යාලෝකය නොලැබීමෙන් වල් නැග ඒම අවසන් වේ. කුඹුරේ ආම්ලික තත්ත්වය වර්ධනය වීම සිදු නොවන්නේ වරින් වර ජලය පුරවා කඩා හැරීමට ලක් කරන බැවිනි. වැපිරීමේ දී කිවුල් ඇළ මනා පරිදි යෙදීම ගැන වැඩි අවධානයක් යොදවන්නේ මේ ආම්ලිකතාවය සහ ලවණතාවය ඇළ කාණුව දිගේ ගලා යෑමට සැලැස්වීමටයි. එම කාලය තුළ ගැඩවිල්ලන් සහ රතු කළු පණුවන් වර්ධනය සිදු වන්නේ පසේ පණු පස මතුකරමිනි. නයිට්‍රජන් ඇතුළු පැළැටියකට අත්‍යවශ්‍ය ප්‍රධාන මූලද්‍රව්‍ය මනා සංයෝගයකින් මේ පණුපස්වල ඇත. තැන්පත්වන රොන්මඩවලද එසේමය. එය පසේ පොහොර තත්වය වර්ධනය කරවන්නකි. මැඩවීමේදී මීගවයන් ගේ කුර පහරට මඩ තැම්බෙන අතර ඒ මගින් ලියද්දේ තිබෙන වල් යට කර ගැනීමද ආරම්භක ක්‍රියාවලියකි. වැපිරීමෙන් පසුව සති දෙකකකින් පසුව අතින් වල් නෙලීම මගින් ද කුඩ මැට්ට වැනි වල් ඉවත් කර ගැනීමට කටයුතු කිරීමද පැරණි ක්‍රමයකි. එහිදී ගෙවිලියන්ගේ විලුඹට ඇවිස්සෙන මඩ නිසා ගොයම පඳුරු ගසමින් වැඩෙන ආකාරය දැක ගන්නට හැකි වේ. වියන් දුඹුලු දිය කර වක්කඩේ දැමීම භෞතික ප්‍රතිකාරයකි. මෙමගින් වල් මර්ධනය සිදුවෙතැයි යන්න ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් ගේ අත්දැකීමකි. වියන් දුඹුළු යනු මුළු තැන් ගෙයි දුම් මැස්ස මතට වැදුණු දුම හේතු කොට ගෙන සෑදෙන්නකි. එම වියන් දුඹුළු වැස්ම ජලයත් සමග ගොයම් පැළයේ රැඳී නවතී. එහිදී සිදු වන්නේ තාවකාලිකව වල්පැළ නැග ඒම වැළැක්වීමයි. නමුත් රසායනික වල්නාශක භාවිත කරන ගොවිතැනේදී සිදු වන්නේ සම්පූර්ණයෙන් වල් පැළ විනාශ කිරීමයි. ඒ සාතක ක්‍රියාවලිය නිසා හිතකර සතුන්වන ක්ෂුද්‍රජීවීන්ද විනාශ වේ. පස නිසරු වීම ආරම්භ වන්නේ එවැනි අවිද්‍යාත්මක ක්‍රම අනුගමනය කිරීමෙනි.

පළිබෝධ මර්දනය -

වී ගොවිතැනට අදාළ පළිබෝධ මර්දනය කිරීම උදෙසා ද විශාල පාරම්පරික දැනුමක් පැරණි ගොවීන් සතුව තිබූ බව ඔවුන්ගේ පාරම්පරික ලේඛන වන පුස්කොළ පොත් විමර්ශනය කිරීමෙන් අවබෝධ කොට ගත හැකිය. එයට අමතරව ගොවීහු මුඛ පරම්පරාගතව සිය දැනුම සංනිවේදනය වන්නට ඉඩහළහ. සිය ගොවිතැන් කටයුතු අතරවාරයේ කාන්සියට පාලුවට කියන සීපද මේ දැනුම සංනිවේදනය කළ ප්‍රධාන මාධ්‍යය විය. කමත් හැල්ල නම් ජන කවි සංග්‍රහයේ මේ පලිබෝධ ගැන සඳහන් වන්නේ මෙසේය.

අල කොළ රෝගය ද ලෙඩක් -
- කොක්කනාව කියා ලෙඩක්

උණ පතයා තවත් ලෙඩක් -
- මේ ලෙස ලෙඩ බලා නොයෙක්

ගොයමට පණු රෝග වැළඳීමට තිබෙන ඉඩ කඩ බොහෝය. කොක්කනාව නොහොත් කොපු පණුවා වර්ධනය වීමෙන් ළපටි ගොයම්පත්‍රය සුදු පැහැ වී හානියට පත් වේ. වර්ෂාව අධික වීම ලියදි සමතලා නොවී ජලය රඳා තිබීම මේ පණුවන් වර්ධනයට හේතු ලෙස දක්වාලිය හැකිය. මේ පණුවා මූලික වශයෙන් දිගින් මි.මී. 6 ක් පමණ වන සලබ කීටයෙකි. මේ සලබයා බිත්තර පනහක් පමණ තැන්පත් කරන්නෙකි. දින හතරකින් පමණ පිටවන කීටයා දින විස්සක් පමණ වර්ධක කාලයක් ගත කරයි. මොවුනට ජලය මගින් සංක්‍රමණය විය හැකිය.

රසායනික ක්‍රමවේදය -

විද්‍යාඥයෝ මේ අහිංසක සලබයා විනාශ කිරීම පිණිස ඩයිමෙතොඒට් නම් සක්‍රීය ද්‍රව්‍ය අඩංගු උග්‍ර පළිබෝධනාශක භාවිත කරති. මෙම රසායනික භාවිතය නිසා ගොයමේ පළිබෝධ ගොදුරු කර ගන්නා හිත මිතුරු සතුන් වන බත්කුරා සහ ඉබිකුරුමිණියාද විනාශ වෙති. එම නිසා ගොයමේ ජෛව ගහනය තුනී වී පළිබෝධ හානි වැඩි වර්ධනය වීමක් සිදු වේ. එම තත්වය ක්‍රමයෙන් වර්ධනය වන අතර යම්



හෙයකින් හදිසියේ කීඩෑ වසංගතයක් පැමිණියහොත් හිත මිතුරු සතුන් නොමැති පරිසරයක ආක්‍රමණශීලී ආකාරයට ඔවුන් වර්ධනය වීමට පටන් ගනී. අවසානයේ සිදුවන්නේ ගොයම පිලිස්සී විනාශයට පත් වීමයි.

පාරම්පරික පළිබෝධ මර්දනය සඳහා අළු සාත්තුව

කොපු පණුවා, කොළ හකුළන දළඹුවා, පුරුක් පණුවා ආදී පළිබෝධ පාලනය කිරීමට පාරම්පරිකව යොදා ගත්තේ අළු සාත්තුවයි. කුඹුරේ වතුර කඩා වියළෙන්නට හැර පසු දින අළු භාජනයක් ගෙන ගොස් උදෑසන පිනිපිට ගොයමට ඉසීම මේ ක්‍රමයයි. අළු සඳහා හලා ගන්නා ලද ලිපේ අළු යොදා ගැනේ. ඉසින ලද අළු ගොයම් ගසේ මෙන්ම කොපු පණුවන්ගේ ද ශරීරවල ඇලේ. වෙසෙසින්ම උන්ගේ පුරුක් අතරට අළු ගමන් කිරීම නිසා කොළ මත සිටින පණුවන් ශරීරය පාලනය කර ගත නොහැකිව බිමට හැලෙති. එසේත් නැතිනම් ගසේ පහත කොටසට වෙති. අළු සාත්තුවෙන් පසු පසුදා උදේ ලියැදිවලට වතුර බඳින බැවින් මේ පණුවෝ වැඩි ප්‍රමාණයක් ජලයට බිලිවෙති. පුරාණයේ දී ජලයේ මිරිදිය මසුන්ද බහුලව සිටි අතර පණුවන් ඔවුනට ද ගොදුරු වෙති. අනතුරුව තෙවැනි දිනයේ දී කැප්පෙට්ටියා අතු යහමින් කඩා ගත් ගොවියා කුඹුරු උඩාවතේ සිට (ලියැද්දේ ඉහළ සිට) පිළිවෙළින් ගොයම පිස දමමින් පහළට එති. එවිට කැප්පෙට්ටියා බූවට දුබල වන පණුවන් ද උන්ගේ බිත්තර ද ජලයට වැටී මසුන්ට ගොදුරු වෙති.

ගොක් මැස්සා ගේ හානිය නිසා උණ පතයා නොහොත් ලූනු ගොබ රෝග ය හට ගනී. සාම්ප්‍රදායික වගාවේදී මෙම හානිය බරපතළ නොවන අතර දින හතරක පමණ ජීවන කාලයක් ගතකරන ගොක් මැස්සා සහ උගේ කීටයා ගොදුරු කර ගැනීමට ගොයම අතරේ ජීවත් වන හිත මිතුරු සතුන්ට හැකිය. අවශ්‍යය වන්නේ උන්ගේ ගහනයට ගැලපෙන ලෙසට වී වගා පරිසරය සකස් කිරීමයි. සිංහල ජනතාව අතර තුඩ තුඩ පවතින ජන කවි පිළිබඳවද අපගේ අවධානය යොමු කිරීමෙන් මෙය තව දුරටත් වටහා ගත හැකිය. ගොයම් කවි, නෙළුම් කවි මෙන්ම කමත් කවි ද විවිධ නාද මාලාවන් ඔස්සේ ගායනා කිරීමෙන් චිත්ත ශක්තියත් එසේම ශක්ති ප්‍රභවයනුත් අවදිකිරීම සිදු වේ. එහි අරමුණ වැඩ පහසු කර ගැනීමයි. වෙහෙස දුරු කරලීමයි. මැතිරීම මගින්



ශක්ති ප්‍රභවයන් අවදි කරගැනීම අනෙක් ක්‍රමයයි. පහන් දැල්වීම, යම් යම් රසායන ද්‍රව්‍ය නිකුත් කරන ශාක භාවිත කිරීම ආදී තවත් ක්‍රම කීපයක්ද ඇත. මේ සියල්ලටම අප කෙම් පහන් යන නාමය යොදා ගනිමු.

සාම්ප්‍රදායික ගොවිතැනෙහි දැනුම විවිධත්වයකින් යුතුය. එම විවිධත්වය තුළ ඒකමිතික බව ඇති කිරීම මගින් විද්‍යාත්මක කාර්යය සඵල කර ගැනීම එහි පරමාර්ථයයි. කුඹුරක් නම් ගොවියා හා ක්ෂේත්‍රය අතර ඒකමිතිය ඇති කිරීම පළමු කාර්යභාරයයි. එසේ නොකොලහොත් භාවිත කරන **කෙම්ක්‍රම**වලින් ප්‍රතිඵලයක් නැතිව යා හැකිය. වල් සතුන් ගෙන් වන හානි වළක්වා ගැනීම උදෙසා **කරණය** (ජ්‍යෝතිෂයේ සඳහන් පඤ්චාඞගයට අයත් සිද්ධාන්තයක් සහ, ගොවිතැනට සත් කරණය නමින් චන්ද්‍රයාගේ තිථිය පදනම්කරගත් සිද්ධාන්තයක්ද ඇත) ආදී ජ්‍යොතිෂමය මූලධර්ම භාවිත කිරීම පිණිස මෙය අත්‍යවශ්‍ය වෙයි. මෙම පියවර සාර්ථක කර ගැනීම සඳහා සමස්ත ක්ෂේත්‍රයටම වගා කාලසටහනක් සකස් කර ගැනීමෙන් විශිෂ්ට ප්‍රතිඵල නෙලා ගත හැකිය.

විවිධ සතුන්ගේ ගති ලක්ෂණ හඳුනා ගැනීම පැරණියන් පුරුදු පුහුණු කළ දෙයකි. වෙසෙසින්ම වැදි ජනතාව තුළ එම කේෂ්ත්‍ර පිළිබඳව මනා පරිචයක් පිහිටා ඇත. පරිසරය සමග තිබූ බැඳියාව නිසා පැරණි ගැමියෝ වල් සතුන් ගේ හැසිරීම ගැන අවබෝධයෙන් යුක්තව සිටියහ. හේන් වගාවේ දී බහුලවම හානි පමුණුවන සත්වයා උෟරා වෙයි. එම නිසා උෟරා ගේ හැසිරීම පිළිබඳ සියුම් අවබෝධයක් ගොවීහු ඇතිකර ගත්හ. වල් අලි රංචු පළවා හැරීමට බොහෝ විට භාවිත කළ කෙම් ක්‍රම අතර මැතිරීම ඉදිරියෙන්ම විය. එයට හේතුව හේනකට යනෙන පුද්ගලයෙකුට වුවද අලියෙකු මුණගැසීමට තිබෙන ඉඩ කඩ වැඩි නිසාය. ගවයා විසින් කුඹුරුවලට සහ කොරටුවලට හානි කරනු ලබන්නේ ගව හිමියාගේ නොසැලකිල්ල නිසාය. එවැනි අවස්ථාවලදී ආරක්ෂා වීමට ද ගොවීහු විවිධ උපක්‍රම යොදා ගත්හ.

කෙම් පහන් (ක්ෂේම කර්ම සහ පහන් දැල්වීම) නම් ක්‍රියාවලියෙන් ගොවිපළ ආරක්ෂා කර ගන්නා ක්‍රම දෙකක් ගැන කියැවෙයි. කෙම් ක්‍රමවලදී බදාදා, සෙනසුරාදා වැනි කෙම්මුර දවස් යොදා ගැනීමෙන් අදාළ කාර්යය වඩාත් සඵල වන බවට විශ්වාසයක් ඇත. පහන් දැල්වීම මගින් කෘමි සතුන්

ආකර්ෂණය කොට ස්වාභාවිකව විනාශව යෑමට සලස්වයි. වල් සතුන් ගෙන් ආරක්ෂා වීමට කරන ලද පහත දැක්වෙන කෙම යොදා ගත යුත්තේ එවැනි දවස්වල බව කියැවේ.

මෙයට භාවිත කරන්නේ වරා, කොස් රිකිලි, ඉදි හෝ මිදි ශාකවල අතු කොටස්ය. කමත් හැල්ලේ තිබෙන කවියක් අනුව කෙම් ඉනි යයි සටහන් කර ඇත්තේ මේවා විය යුතුය. දුම් කබලකට පොල් කටු අඟුරු සකස් කර එයට දුම්මල දමා ඉහතකී ශාක අතු මිනිස් තරමට වඩා උසකින් තබා දුම් ඇල්ලීම මෙහි පළමු පියවරයි. දිනයක් ගත වී පසු දින උදයේ ද නැවත දුම් අල්ලා පෙර කී අතු වර්ග තුනෙන් එක බැගින් ගෙන මිටි තුනක් බැඳ නැවතත් දුම් දී කෙතේ හෝ කුඹුරේ සීමාවේ තුන් පළක සිටුවිය යුතුය. මෙය කළ යුත්තේ උඩු සුළඟ නෙහොත් සුළඟ හමන දිශාව හසුවන පරිදිය. ඉන් පසු යටි සුළඟට අසුවන සේ නොහොත් සුළං හමන දිශාවට ප්‍රතිවිරුද්ධ දිශාවෙන් ගොවිපළෙන් පිට වීම කළ යුතුය. මෙම ක්‍රමයේ දී අතු අත තිබෙන විට කිසිවෙකුත් සමග කතා නොකිරීමට වගබලා ගත යුතුය. එසේම ගොවියා තුන් වරුවක් යන තුරුම ගොවිපළට යෑමෙන් වැළකිය යුතුය. කුඹුරක් නම් ගොයම් පිදීම ආරම්භ වූ අවස්ථාවේ දී මෙය කිරීම වඩාත් සුදුසුය. ගොයම් බණ්ඩිය පිපිරී අවම වශයෙන් කරල් තුනක් වත් එළියට පැමිණ තිබීම අවශ්‍ය වේ. මෙම කෙම සිදු කළ විට හේනක නම් මෙනේරි වැනි ධාන්‍ය වර්ග එකවර පූදින බව අත්දැකීම් ඇත්තෝ ප්‍රකාශ කරති. එසේම මැසි උවදුරු ද දුරු වෙයි. මැස්සන්ට කරන වෙනත් කෙම් මැතිරීම්ද මෙයින් සාර්ථක වන බව කියැවෙයි.




මෙහිදී යොදා ගන්නා අතුවල වෙසෙසියාව තේරුම් ගැනීම වඩා වැදගත්ය. වරා, කොස් වැනි කිරි ශාකවල සාමාන්‍යයෙන් කෘමිනාශක ගුණය ඇත. ඒවායේ එක් අත්ත බැගින් මිටි තුනක් බැඳීම එම ගුණය තවත් ශක්තිමත් කිරීමකි. එයට දුම් දීම මගින් එහි ශක්තිය නෙහොත් ප්‍රාණය එක තැනකට ගොනු වේ. උඩු සුළඟට ගෙන යාමෙන් අදහස් කෙරන්නේ කෙත ආශ්‍රිතව අභිනවයෙන් ගොඩ නැගුණ ශක්තිය පිටතට සංනිවේදනය කරවීමයි. අනතුරුව අතු සිටුවා යටි සුළඟට පිටවීමෙන් මිනිස් ගන්ධය පිටතට පැතිරීම වැළැක්වේ. එයින් ආරෝපණය කළ ශක්තියට හානි නොවෙයි. මෙය තර්කානුකූලව තේරුම් ගැනීම යම් තරමකින් අපහසුය. එහෙත් ගොවිපළ බල ගැන්වීම තුළින් බොහෝ අතුරු අන්තරාවලින් ආරක්ෂා කරවීම සිදු කළ බවට මෙය මනා සාක්ෂියකි. වන සතුන්ගෙන්වන හානි වළක්වා ගැනීමට අනුගමනය කළ මන්ත්‍ර ද රාශියෙකි. මෙම මැතිරීම් මගින් ආරෝපණ වන ශක්තිය මැසි හානි වළක්වන බවද රෝග වළක්වන බවද ප්‍රත්‍යක්ෂ දැනුමකි. එම දැනුම නිර්මාණයව තිබෙන්නේ සමස්තය පිළිබඳ මූලික ඒකමිතිය ආරක්ෂා කර ගනිමිනි.

මැතිරීම් පිළිබඳ විද්‍යාත්මක සත්‍යය

කුරුමිණියන් කෑ තල කොළ හතරක් ගෙන **ඕං නමෝ නීල නීල ඒස්වාහං** නම් මන්ත්‍රය කටුවකින් ලියා කළු මැද එම පත් ඉරුවලට තුන්සිය විසි හතර වරක් එම මන්ත්‍රයෙන්ම ජප කළ යුතුය. ඉන් පසු කොළ කැබලි හතර බට ලී පුරුක් හතරක් තුළට දමා අහු ලීයෙන් සාදා ගත් ඇබ ගසා හිර කිරීම ක්‍රමවේදයයි. අනතුරුව හේනේ හෝ කුඹුරේ සිවු කොනේ තැන්පත් කිරීම සිදු කළ යුතුය. මෙය කළ යුත්තේ රාත්‍රී දොළහත් එකත් අතර කාලයේ දීය. අනතුරුව තුන් වරුවක් පමණ කෙතට යෑමෙන් වැළකිය යුතුයයි නියමයකි. වත්මන් නවීන සමාජය තුළ මේ මැතුරුම් ක්‍රම පිළිබඳව මහත් විශ්වාශයක් නොමැත. නමුත් පිරිත් කිරීම සහ පිරිත් නූලේ ආනුභාවයක් ඇති බව කවුරුත් දනිති. එහෙත් මන්ත්‍ර ශාස්ත්‍රයෙන් වැඩ ගැනීමට දක්වන්නේ මැලි කමකි. එවා මිථ්‍යා ව්‍යවහාර හෝ ගර්හිත විද්‍යා ලෙස සැලකීමක් තිබේ. ජපානයේ ජීවත් වන මසාරු ඉමාටෝ විසින් (The messages of water) නම් වූ ග්‍රන්ථයක් පළ කර ඇත. එහි සඳහන් ආකාරයට ෆියුජිවාරා වේල්ල අසල ජලතලය ආශ්‍රිතව විවිධවූ සංගීත ක්‍රම යොදා ගෙන කරන ලද පරීක්ෂණයේ දී ජලයේ වෙනසක් සිදු වන බව නිරීක්ෂණය කර ඇත. අනතුරුව කාටෝ හොකයි නම් බෞද්ධ ස්වාමීන් වහන්සේ විසින් ද විවිධ වූ ජල සාම්පලවලට කරන ලද පිරිත් නැවත පරීක්ෂණයට භාජනය කර ඇත. එහිදීද ජලය දීප්තිමත් වන ආකාරයද ස්ඵටික භාවයට පෙරළෙන ආකාරය ද නිරීක්ෂණය කරන්නට ඔවුන්ට හැකි වී යයි සඳහන් කර ඇත. අනතුරුව ගොරහැඩි සංගීතය ද නොසරුප් වදන් ද භාවිතයෙන් කරන ලද පරීක්ෂණයේදී තහවුරු වී ඇත්තේ ජලයේ වෙනස් වීමයි. දීප්තිමත් පැහැය අතුරුදහන් වීමයි. මෙය නවීන සොයා ගැනීමකි. මන්ත්‍ර වල බලය නවීන විද්‍යාත්මකව තහවුරු කිරීමක් යයි ද කල්පනා කළ හැකිය. මේ ලෙස කල්පනා කර බලන කල්හි පුරාණ ගොවීන් අතර දක්නට තිබූ දැනුම් සම්භාරය අතිශයින් විද්‍යාත්මක පදනමක් මත ගොඩනංවා ගෙන පවත්වාගෙන පැමිණි බව තහවුරු වේ.

මතුගම සෙනෙවිරුවන්
0714287695 / 0775384914



ගණිත විනෝදයෙන් බිඳක් -

"ගණිත විනෝදය", පරිච්ඡේද 11කින් සමන්විත වූ ග්‍රන්ථයකි. එයින් බිඳක් විදුරාව සඟරාවෙහි මෙම කලාපයේ පළ කෙරෙන අතර සම්පූර්ණ ග්‍රන්ථය මකොටසින් කොටස අඛණ්ඩව ඉදිරි කලාපවල පළ කිරීමට තීරණය කොට තිබේ. එය, විදුරාව කියවන සිසු දරු දැරියන්ට මෙන්ම ගුරුභවතුන්හටද ප්‍රයෝජනවත් වනු ඇති බව අපගේ හැඟීමයි.

ගණිත ගැටළු 09 - 13 දක්වා මෙම කලාපය තුළින් අපි ඔබට ඉදිරිපත් කරමු.

09. ප්‍රයෝගකාර ගස්මුල

"බොහෝ කාලයකට ඉස්සර ගමේ ගණිතඥයෙක් ඉදිරිපත් කරපු ගණනක් මේ ගැටළුව මගේ සිහියට නංවනව." අවසාන ගැටළුව ඉදිරිපත් කළ තැනැත්තාගේ අසල්වැසියා පැවසුවේය."එය දිග එමෙන්ම හාස්‍යජනක කතාවක්. දවසක් ගමේ ගොවියෙකුට කැලේදී නාඳුනන මහළු මිනිහෙක් හමුවුණා. ඔවුන් කතාවට වැටුනා.මහළු මිනිහා ගොවියා දිහා උවමනාවෙන් බලා මෙහෙම කීවා.
"මම දන්නවා මේ කැලේ පුදුමාකාර ගහක මුලක් තියෙන තැනක්. එය උවමනා වේලාවක උදව් වෙනවා."
"කොහොමද උදව් වෙන්නේ? ලෙඩ සුව කරනවාද?"
"ලෙඩ සුවකරනව නොවෙයි මුදල් දෙගුණ කරනවා. මුදල් පසුම්බියක් ඒ මුල් යටින් තියා සීයට ගණන් කරපුවාම පසුම්බියේ ඇති මුදල් දෙගුණ වෙනවා. පුදුම මුලක් ඒක!"
"මටත් වාසනාව උරගා බලන්න ඇත්නම් හොඳයි." ගොවියා බලාපොරොත්තු සහගතව කීවා.
"ඒක කරන්න පුළුවනි. ඒ සඳහා ගෙවිය යුතුයි."
"කාටද ගෙවිය යුත්තේ? හුඟක් ගෙවන්න ඕනද?"
"එතැනට යන්න පාර පෙන්වන අයට, ඒ කියන්නේ මට. හුඟක් ගෙවිය යුතුද යන්න වෙනම ප්‍රශ්නයක්."
ඔවුන් කේවල් කරන්න පටන්ගත්තා. ගොවියාගේ පසුම්බියේ ඇත්තේ ඉතා සුළු ගණනක් බව දැනගත් මහල්ලා සෑම දෙගුණ කිරීමකටම රූබල් 1යි කොපෙක් 20ක් ලබා ගැනීමට කැමති වුණා.
මහළු මිනිසා ගොවියාව කැලේ මැදට එක්කගෙන ගියා. බෙහෝ වේලාවක් හොයලා මුලින් කපපු නත්තල් ගහක දිරාගොස් ඇති පරණ මුලක් ළඟට ඔවුන් ආවා. ගොවියාගේ පසුම්බිය මුල යට තැබූ මහල්ලා සියයට ගණන් කළා. ඊට පසු මුල අතපත ගා පසුම්බිය ගොවියා අතට දුන්නා.
ගොවියා මුදල් ගණන් කරලා බැලුවා. ඇත්තටම මුදල් දෙගුණවී ඇතිබව දුටු ඔහු පොරොන්දු වූ ආකාර රූබල් 1.20 ක් මහල්ලාට දී නැවතත් පසුම්බිය පුදුම මුල යටින් තියන ලෙස ඉල්ලා හිටියා.
මහල්ලා නැවතත් පසුම්බිය මුල යටින් තබා සියයට ගැන ටික වේලාවක් මුල අතපත ගෑවා. පසුම්බියේ තිබූ මුදල දෙගුණවී තිබුණා. ඒ වතාවෙත් මහල්ලාට රූබල් 1.20 ක් ලැබුණා. තුන්වැනි වතාවටත් මුල යටින් පසුම්බිය තියා පළමු දෙවතාවේ කළ දෙයම කළා. ඒ වතාවේත් මුදල් දෙගුණවී තිබුණා. ගොවියා පොරොන්දුවූ පරිදි මහල්ලාට රූබල් 1.20 ක් ඒ නැවතත් ගෙවීමෙන් පසු පසුම්බියේ කොපෙක් එකක්වත් ඉතිරිවූයේ නැහැ. මෙම සූදු ක්‍රීඩාවේදී ගොවියා ළඟ තිබූ මුදල් සියල්ලම පරදා වුණා.
මේ පුදුමාකාර මුදල් දෙගුණකිරීමේ රහස ඔබට පැහැදිලියි මම හිතනවා: මහල්ලා අතපත ගෑවේ නිකමට නොවෙයි. ඒ වුණත් වෙනත් ප්‍රශ්නයකට ඔබට උත්තර දෙන්න පුළුවන්ද? පුදුම මුල යට තැබීමට පෙර ගොවියාගේ පසුම්බියේ කොපමණ මුදල් ප්‍රමාණයක් තිබුණාද?"

10. දෙසැම්බර් මාසය පිළිබඳ ගැටළුව

"මිත්‍රවරුනි මම භාෂා විශාරදයෙක්. ගණිතය ගැන මම දන්නේ නැහැ" ගැටළුව ඉදිරිපත් කිරීමේ වරාය පැමිණි මැදි වයසේ මිනිසෙක් තම ගැටළුව ආරම්භ කළේය." එම නිසා ගණිතමය ගැටළු මගෙන් බලාපොරොත්තු වෙන්න එපා. මා දන්නා ක්ෂේත්‍රයේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නම්. දින දර්ශනය පිළිබඳ ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට මට අවසර දෙන්න."
"අවසරයි!"
"අවුරුද්දේ දොළොස්වැනි මාසය අපි "දෙසැම්බර්" නමින් හඳුන්වනවා. ඔබ "දෙසැම්බර්" යන්නෙහි තේරුම දන්නවද? එම වචනය සෑදී තිබෙන්නේ ග්‍රීක් වචනයක් වන "ඩෙකා" එනම් දහය යන වචනයෙනුයි. "ඩෙකාලීටර්" - ලීටර් දහය හා "ඩෙකාඩා" - දශකය යන වචන සෑදී තිබෙන්නේ මෙම වචනයෙන්මයි. එම නිසා දෙසැම්බර් මාසය දහවැනි මාසය යන තේරුම උසුලනවා. මේ ප්‍රතිවිරොධිතාවය විස්තර කරන්නේ කෙසේද?"
"තව එක ගැටළුවක් ඉතිරිවෙලා තිබෙනවා" මූලාසනයෙන් දැනුම් දුන්නේය.

11. අංක ගණිතමය ඇස්බැඳුම

"මට අන්තිමට ගැටලු ඉදිරිපත් කරන්න සිදු වී තිබෙනවා. මම වෙනස් විදියේ අංකගණිතමය ඇස්බැඳුමක් ඉදිරිපත් කරන්නම්. එහි රහස හැකිනම් සොයාගන්න. ඔබලාගෙන් කවුරු හෝ, නැතිනම් සභාපතිතුමා මට නොපෙනෙන ලෙස ඉලක්කම් තුනක සංඛ්‍යාවක් ලියන්න "
"බිංදුවේ අංකය තිබිය හැකිද?"
"කිසිම සීමාවක් නැහැ. කැමතිම ඉලක්කම් තුනක සංඛ්‍යාවක් ලියන්න"
"ලීවා! දැන් මොකද කරන්න ඕන?"
"එම සංඛ්‍යාවම එය ළඟින් එක පේළියට ලියන්න. දැන් ඉලක්කම් හයක සංඛ්‍යාවක් ඔබට ලැබෙනවා."
"ඉලක්කම් හයක සංඛ්‍යාවක් ලැබෙනවා"
"දැන් ඒ කඩදාසිය ඔබේ අසල වාඩිවී සිටින්නාට දෙන්න. එයා එම සංඛ්‍යාව හතෙන් බෙදපුදෙන්."
"කියන්න නම් අමාරුවක් නැහැ. සමහරවිට එම සංඛ්‍යාව හතෙන් නොබෙදනවා වෙන්න පුළුවනි."
"කරදර වෙන්න එපා. එම සංඛ්‍යාව ඉතිරි නැතිව හතෙන් බෙදෙනවා."
"ලියපු සංඛ්‍යාව දන්නෙත් නැහැ. එහෙත් බෙදෙන බව කියනවා."
"ඉස්සරවෙලා බෙදන්න පස්සේ කතාකරමු."
"ඔබේ වාසනාවට ඉතිරි නැතිව බෙදෙනවා"
"උත්තරය මට දන්වන්නේ නැතිව ඔබ අසල සිටින තැනත්තාට දෙන්න. ඔහු එය 11න් බෙදපුදෙන්."
"නැවතත් ඉතිරි නැතිව බෙදෙයි කියලා හිතනවද?"
"බෙදන්න, ඉතිරිවෙන්නේ නැහැ."
"ඇත්තටම ඉතිරි නැතිව බෙදුනා! දැන් මොකද කරන්න ඕන?"
"ප්‍රතිඵල ඊළඟ අයට දෙන්න. අපි එය...ආ, 13 න් බෙදමු."
"තෝරාගන්නා හැටි හොඳමදි. සංඛ්‍යා සුළු ගණනයි 13 න් ඉතිරි නැතිව බෙදෙන්නේ, ආහ්, නැහැ, නැහැ, ඉතිරි නැතිව බෙදෙනවා. ඔබේ වාසනාව !"
"දැන් උත්තරයත් සමග කඩදාසිය මා අතට දෙන්න. සංඛ්‍යාව මට නොපෙනෙන්න හොඳට කඩදාසිය නමන්න."
කඩදාසිය දිග නොහැරම "ඇස්බැඳුම් කරුවා" එය සභාපති අතට දුන්නේය.
"ඔබ හිතපු සංඛ්‍යාව ලබාගන්න අවසර දෙන්න. හරිද?"
"හරියටම හරි!" කඩදාසිය දෙස බැලූ ඔහු පුදුමයෙන් උත්තර දුන්නේය. "මම හිතපු සංඛ්‍යාව තමා මේ. මීට වඩා තේරවිලි නැති නිසා අපේ රැස්වීම අවසාන කරන්න මට අවසර දෙන්න. වැස්සත් නැවතිලා තිබෙනවා. ගැටලුවලට පිළිතුරු අද රාත්‍රී කෑමෙන් පසු සාකච්ඡා කරමු. පිළිතුරු මා වෙත ලැබෙන්න සලස්වන්න.

විසඳීම්

09. ප්‍රයෝගකාර ගස්මුල

මෙම ගැටලුවද අවසානයේ සිට විසඳිම අසීරු නොවේ. තුන්වැනි දෙගුණ කිරීමට පසු පසුම්බියේ ඉතිරි වූයේ රූබල් 1.20 ක් බව අපි දනිමු. (අවසාන වරට මහල්ලා එම මුදල් ලබාගත්තේය). එම දෙගුණ කිරීමට ප්‍රථම තිබූ මුදල් ප්‍රමාණය කොපමණද? කොපෙක් 60කි. දෙවැනි වරට මහල්ලාට ගෙවීමෙන් පසු ගොවියා ළඟ ඉතිරි වූ මුදල එම කොපෙක් 60ය. ගෙවීමට ප්‍රථම පසුම්බියේ තිබූ මුදල 0.60 + 1.20 රූබල් 1 කොපෙක් 80කි.
රූබල් 1.80 ක් පසුම්බියේ පහළ වූයේ දෙවැනි දෙගුණ කිරීමෙන් පසුවය. ඊට ප්‍රථම පසුම්බියේ ඉතිරිව තිබුණේ කොපෙක් 90 කි. එනම් පළමු වැනි දෙගුණ කිරීමෙන් පසු මහල්ලාට රූබල් 1 කොපෙක් 20 ක් ගෙවීමෙන් අනතුරුව ඉතිරි වූ මුදලය. ගෙවීමට ප්‍රථම ඔහු ළඟ තිබූ මුදල කොපමණ දැයි දැන් අපි දනිමු:

පළමුවැනි දෙගුණ කිරීමට පසු	1.05 × 2 = 2.10
පළමුවැනි ගෙවීමෙන් පසු	2.10 - 1.20 = 0.90
දෙවැනි දෙගුණ කිරීමෙන් පසු	0.90 × 2 = 1.80
දෙවැනි ගෙවීමෙන් පසු	1.80 - 1.20 = 0.60
තුන්වැනි දෙගුණ කිරීමෙන් පසු	0.60 × 2 = 1.20
තුන්වැනි ගෙවීමෙන් පසු	1.20 - 1.20 = 0

0.90 + 1.20 = 2.10 එම නිසා දෙගුණ කිරීමට ප්‍රථම ඔහු ළඟ තිබූ මුදල රූබල් 1 කොපෙක් 05 කි.පිළිතුරු නැවතත් පරීක්ෂාකර බලමු.

පසුම්බියේ මුදල් ප්‍රමාණය

10. දෙසැම්බර් මාසය පිළිබඳ ගැටලුව

අප භාවිතා කරන දින දර්ශණය ආරම්භ වූයේ පැරණි රෝමන් දින දර්ශනයෙනි. රෝමන්වරුන් (ජූලියස් සීසර්ට ප්‍රථම) වර්ෂයේ ආරම්භය ලෙස සලකන ලද්දේ ජනවාරි 1 වැනි දා නොව මාර්තු 1 වැනි දාය. ඒ අනුව දෙසැම්බර් මාසය අවුරුද්දේ දහවැනි මාසය ලෙස සැලකිණි. වර්ෂයේ ආරම්භය ජනවාරි 1 වැනි

මාසයේ හැඳින්වීම	හැඳින්වීමේ අර්ථය	අනුක්‍රම අංකය
සැප්තැම්බර්	හත්වැනි	9
ඔක්තෝබර්	අටවැනි	10
නොවැම්බර්	නවවැනි	11
දෙසැම්බර්	දහවැන	12

දා වූ පසුවද ඒ ඒ මාසවල හැඳින්වීම වෙනස් නොවීය. දැනට පවතින දින දර්ශනයේ සමහර මාසවල අනුක්‍රම අංකයේ හා හැඳින්වීමේ ප්‍රතිවිරෝධීතාවය මේ අනුව සිදුවිය.

11. අංක ගණිතමය ඇස්බැඳුම

අදහස් කරන ලද සංඛ්‍යාවට කුමක් කළේදැයි සොයා බලමු. ප්‍රථමයෙන්ම තෝරාගත් අංක තුනේ සංඛ්‍යාවට එම සංඛ්‍යාව නැවතත් ලියන ලදී. තෝරාගත් සංඛ්‍යාවට බිංදු තුනක් ලියා නැවත එයට එම සංඛ්‍යාව එකතු කිරීමට එය සමානය; නිදර්ශනයක්:

8,72, 872 = 8,72,000 + 872

සංඛ්‍යාවට කුමක් කළේදැයි අපට දැන් පැහැදිලිය: එය 1000න් ගුණ කර නැවතත් එයට එම සංඛ්‍යාවම එකතු කරන ලදී: එනම් එම සංඛ්‍යාව 1,001 න් ගුණ කර ඇත.
ඊට පසු එම ගුණකිරීමට කුමක් කළේද? එය අනුක්‍රමයෙන් 7න්, 11න් හා 13න් බෙදන ලදී. එනම් අවසාන වශයෙන් එම සංඛ්‍යාව 7 × 11 × 13 1,001 න් බෙදන ලදී.
ඒ අනුව එම සංඛ්‍යාව 1,001 න් ගුණකර නැවත 1,001 න් බෙදන ලදී. එම නිසා අදහස්කරන ලද සංඛ්‍යාවම පිළිතුරු ලෙස ලැබීම පුදුමයක් නොවේ.

* * *

විවේකාගාරයේ තේරවිලි අවසාන කිරීමට ප්‍රථම, ඔබේ මිතුරන් සමග විනෝදවිය හැකි අංක ගණිතමය ගැටලු දෙකක් සලකා බලමු. ඉන් එක් ගැටලුවක් සංඛ්‍යා සෙවීමෙන්ද අනෙක භාණ්ඩ අයිතිකරු සෙවීමෙන්ද සමන්විත වේ.
මෙම පැරණි, සමහර විට සියලු දෙනාම දන්නා ගැටලු, කුමක් මත පදනම් වී ඇත්දැයි සියලු දෙනාම නොදන්නවා විය හැකිය. ගැටලු වල න්‍යායාත්මක පදනම නොදැන එය අවබෝධයකින් යුතුව විසඳිය නොහැක. විශේෂයෙන්ම පළමුවැනි ගැටලුව විසඳීමේදි මූලික වීජගණිතය වෙත ආපසු යෑමට අපට සිදුවේ.

12. මකාදමා ඇති අංකය

අංක වැඩි ගණනකින් සමන්විත සංඛ්‍යාවක් හිතාගැනීමට ඔබේ යහළු වන්ට කියන්න, උදාහරණයක් වශයෙන් 847. එම සංඛ්‍යාවේ අංකවල එකතුව (8+4+7) = 19. එම සංඛ්‍යාවෙන් අඩුකරන ලෙස ඔවුන්ට දන්වන්න: ඔහු ළඟ ඉතිරිවන සංඛ්‍යාව

847 - 19 = 828

එම සංඛ්‍යාවෙන් ඔහු කැමති අංකයක් මකා දමා ඉතිරි අංක ඔබට දන්වන ලෙස ඔහුට කියන්න. ඔබ එකවරම, හිතන ලද සංඛ්‍යාව නොදන්නා මුත් මකාදමන ලද අංකය කියන්න.
එය ඔබට කළ හැක්කේ කෙසේද? එය ලෙහෙසියෙන් කළ හැකිය: ඔබට දන්වන ලද අංකවල එකතුව සමග එකතු කළ විට 9 යෙන් ඉතිරි නැතිව බෙදිය හැකි ඉතාමත්ම කිට්ටු සංඛ්‍යාව සොයාගන්න. උදාහරණයක් වශයෙන් 828 න් පළමුවැනි අංකය (8) මකාදමන ලද්දේ නම් ඔබට දන්වන ලද්දේ 2 හා 8 ය. ඒවා එකතු කළ විට 2 + 8 = 10. එම සංඛ්‍යාවට වෙනත් සංඛ්‍යාවක් එකතු කිරීමෙන් පසු ඉතිරි නැතිව 9 න් බෙදිය හැකි කිට්ටුම සංඛ්‍යාව 18 ඔබට පෙනේ. එනම් එකතුකළ යුතු සංඛ්‍යාව 8 ය. මකාදමන ලද අංකයද 8 ය.
එය ලැබෙන්නේ කෙසේද? යම් සංඛ්‍යාවකින් එම සංඛ්‍යාවේ අංකවල එකතුව අඩුකළ විට 9 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාවක් ඉතිරි විය යුතුය. එනම් එම සංඛ්‍යාවේ අංකවල එකතුවද 9 න් බෙදිය හැකි සංඛ්‍යාවක් ඉතිරිවිය යුතුය. දෙන ලද සංඛ්‍යාවේ සිය ස්ථානය a ද, දශස්ථානය b ද ඒකස්ථානය c ද යැයි සිතමු. එනම් එම සංඛ්‍යාව පහත ඒකකයෙන් පෙන්නුම් කළ හැකිය.

100a + 10b + c

එම සංඛ්‍යාවෙන් එහි අංකවල එකතුව a + b + c අඩුකරමු
100a + 10b + c + (a + b + c) =
99a + 9b = 9 (11a + b)
ඇත්තෙන්ම 9 (11a + b), 9 යෙන් බෙදිය හැකිය, එනම් සංඛ්‍යාවකින් එම සංඛ්‍යාවේ අංකවල එකතුව අඩුකිරීමෙන් ලැබෙන ඵලය අනිවාර්ය ලෙසම 9 න් ඉතිරි නැතිව බෙදිය හැකිය.
ගැටලුව විසඳීමේදී ඔබට දන්වන ලද අංකවල එකතුව 9 යෙන් බෙදෙනවා විය හැකිය (නිදර්ශනයක්: 4 සහ 5). එයින් පෙන්නුම් කරන්නේ මකාදමන ලද අංකය 0 හෝ 9 හෝ බවය.
එම ගැටලුවේම වෙනත් ක්‍රමයක්ද ඇත. අදහස් කරන සංඛ්‍යාවෙන් එහි ඉලක්කම්වල එකතුව අඩුකරනවා වෙනුවට එම සංඛ්‍යාවේ ඉලක්කම් ඔබ කැමති අනුපිළිවෙළට ලියා අඩුකරන්න (එම සංඛ්‍යාව අදහස් කරන සංඛ්‍යාවට වඩා වැඩි නම් වැඩි සංඛ්‍යාවෙන් අඩු සංඛ්‍යාව අඩු කරන්න). නිදර්ශනයක් වශයෙන් 8,247 සංඛ්‍යාවෙන් 2,748 අඩුකළ හැකිය. පසුව ඉහත ආකාරයටම කළ හැකිය. 8,247 - 2,748 = 5,499; 4 අංකය මකා දමා ඇතැයි සිතන්න. එමනිසා 5 + 9 + 9 = 23; 9 යෙන් ඉතිරි නැතිව බෙදෙන කිට්ටුම සංඛ්‍යාව 27 ය. එමනිසා මකාදමන ලද ඉලක්කම 27 - 23 = 4.

13. ගත්තේ කවුද?

මෙම හාස්‍යජනක එමෙන්ම බුද්ධිමත් ඇස්බැඳුම පෙන්වීමේදී සාක්කුවේ සඟවාගත හැකි කුඩා භාණ්ඩ තුනක් පිළියෙළ කර ගත යුතුය. උදාහරණයක් වශයෙන් පැන්සලක්, යතුරක් හා කුඩා දුනු පිහියක් පිළියෙළ කර ගන්න. ඒ හැර කජු මද 24 සමග පිඟානක්ද මේසය මත තබන්න. කජු මද නොමැතිනම් ගිනිකුරු 24 ක් ගත හැකිය.
ඔබ නැති අතර පැන්සලය, යතුර හා දුනු පිහිය සඟවා ගැනීමට ඔබේ මිතුරන් තිදෙනෙකුට දන්වන්න. ඔවුන් වෙනවෙනම ගත් භාණ්ඩ මොනවා දැයි දැන්වීම ඔබෙන් බලාපොරොත්තුවේ.
එය කරන්නේ මෙසේය. මිතුරන් භාණ්ඩ සඟවා ගැනීමෙන් පසු ඔබ කාමරයට පැමිණ පීරිසියේ ඇති

කජුමද ඔබේ යහළුවන්ට බෙදා දෙන්න. එය කළ යුත්තේ පළමුවැන්නාට එක් කජු මදයක්ද දෙවැන්නාට කජුමද දෙකක්ද තුන්වැන්නාට කජුමද තුනක්ද බැගින්. නැවතත්, පැන්සලය ගත් මිතුරාට ඔහුට දෙන ලද කජුමද සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක්ද, යතුර ගත් මිතුරාට ඔහුට දෙන ලද කජුමද සංඛ්‍යාව මෙන් දෙගුණයක්ද, දුනුපිහිය ගත් තැනැත්තාට ඔහුට දෙන ලද කජුමද සංඛ්‍යාව මෙන් හතර ගුණයක්ද ගන්නා ලෙස කියා කාමරයෙන් ඉවත යන්න.
ඉතිරි කජුමද සංඛ්‍යාව පීරිසියේ තිබිය යුතුය.
මේ සියල්ලම කළ පසු ඔබ කාමරයට ආපසු පැමිණ පීරිසියේ ඉතිරිව ඇති කජුමද දෙස බලා එක් එක් භාණ්ඩය ගත් තැනැත්තා නම් කරන්න.
රහස්‍ය සහායකයකුගෙන් තොරව මෙම ඇස්බැඳුම පෙන්වන නිසා එය වඩාත් පැටලුම් සහගතය. මෙහි කිසිම රැවටීමක් නැත. එය සම්පූර්ණයෙන්ම පදනම් වී ඇත්තේ අංකගණිතමය ගණනයන් මතය. ඔබ එක් එක් භාණ්ඩය ගත් තැනැත්තා නම්කරන්නේ පීරිසියේ ඉතිරිවී ඇති. කජුමද සංඛ්‍යාව අනුවය. එහි ඉතිරිවන්නේ 1 සිට 7 දක්වා වූ සුළු සංඛ්‍යාවකි. එකවරම ඔබට එය ගිණිය හැකිය. එහෙත් ඉතිරිව ඇති කජුමද සංඛ්‍යාව අනුව එක් එක් භාණ්ඩය ගත් තැනැත්තා සොයන්නේ කෙසේද?
හැම අවස්ථාවකම මිතුරන් අතර භාණ්ඩ බෙදා ගැනීමේදී ඉතිරිවන කජුමද සංඛ්‍යාව වෙනස් වේ. ඒ කෙසේදැයි අපි දැන් සලකා බලමු.
කජුමද එක, දෙක හා තුන බැගින් ලබාගත් ඔබේ මිතුරන්ගේ නම් පිළිවෙළින්

සු.	නි.	සි.
a	b	c
a	c	b
b	a	c
b	c	a
c	a	b
c	b	a

සුනිල්, නිමල් හා සිරිල් යැයි සිතමු. නම්වල මුල් අකුරුවලින් ඔවුන් හඳුන්වමු:
සු, නි, සි, භාණ්ඩද අකුරුවලින් හඳුන්වමු: පැන්සලය - a, යතුර - b,
පිහිය - c. භාණ්ඩ මිතුරන් අතර බෙදිය හැක්කේ කෙසේද? ආකාර හයකි.

භාණ්ඩ බේදීමේ වෙනත් ආකාරයක් තිබිය නොහැකිය. ඉහත චක්‍රය සියලුම සංයෝජනයන් පෙන්නුම් කරයි.
ඒ අවස්ථා 6 යේ එක් එක් අවස්ථාවට ගැලපෙන ඉතිරිවන කජුමද සංඛ්‍යාව අපි දැන් සොයා බලමු:

සෑම අවස්ථාවකම ඉතිරිවන සංඛ්‍යාව වෙනස් බව ඔබට දැන් දැකිය හැකිය. එම නිසා ඉතිරිවන සංඛ්‍යා දන්නේ නම් ඒ ඒ භාණ්ඩය සඟවාගෙන ඇති තැනැත්තා ඔබට ලෙහෙසියෙන් සොයාගත හැකිය. නැවතත් තුන්වැනි වතාවට ඔබ කාමරයෙන් ඉවත ගොස් ඉහත චක්‍රය සටහන් කර ඇති ඔබේ සටහන් පොත බලන්න. (ඇත්ත වශයෙන්ම අවශ්‍ය පළමුවැනි හා අවසාන සිරස් පේළි පමණි); මතක තබාගැනීමට අවශ්‍යතාවයක් නැත. කවුරු කුමන භාණ්ඩයක් සඟවා ගෙන ඇත්දැයි චක්‍රය පෙන්වා දෙයි. උදාහරණයක් වශයෙන්, පීරිසියේ කජුමද 5 ක් ඉතිරිව තිබුණේ යැයි සිතමු. එයින් අදහස්වන්නේ (b,c,a) සුනිල් ළඟ යතුරත්, නිමල් ළඟ පිහියත්, සිරිල් ළඟ පැන්සලයත් සඟවාගෙන ඇති බවය.
ඇස් බැඳුම සාර්ථක වීමට නම් ඒ ඒ මිතුරාට කොපමණ කජුමද බෙදා දෙන ලද දැයි ඔබ නිවැරදිව මතක තබාගත යුතුය (ඉහත කළ පරිදි හෝඩියේ අකුරු පිළිවෙළට එය කරන්න).

සු. නි. සි.	ලබාගන්නා ලද කජුමද සංඛ්‍යාව	එකතුව	ඉතිරිය
a b c	1+1=2; 2+4=6; 3+12=15	23	1
a c b	1+1=2; 2+8=10; 3+ 6= 9	21	3
b a c	1+2=3; 2+2=4; 3+12=15	22	2
b c a	1+2=3; 2+8=10; 3+ 3= 6	19	5
c a b	1+4=5; 2+2=4; 3+ 6= 9	18	6
c b a	1+4=5; 2+4=6; 3+ 3= 6	17	7